වාර්ෂික වාර්තාව සහ ගිණුම්

ஆண்டறிக்கையும் கணக்குகளும்

ANNUAL REPORT & ACCOUNTS

01-04-2023---31-03-2024

ජාතික ලුණු සමාගම

தேசிய உப்பு நிறுவனம்

NATIONAL SALT LIMITED

ජාතික ලුණු සමාගම
தேசிய உப்பு நிறுவனம்
NATIONAL SALT LIMITED

කර්මාන්ත අමාත්‍යාංශය

கைத்தொழில் அமைச்சு

Ministry of Industries

රජයට අයත් සමාගමකි

அரசுக்குச் சொந்தமான கம்பனி

Government Owned Company

වාර්ෂික වාර්තාව සහ ගිණුම්
ஆண்டறிக்கையும் கணக்குகளும்
ANNUAL REPORT & ACCOUNTS

2023.04.01 – 2024.03.31

පටුන

1.	සභාපතිතුමාගේ ප්‍රකාශය	01
2.	සාමාන්‍යාධිකාරීතුමන්ගේ පණිවිඩය	02
3.	සංස්ථාපිත තොරතුරු	03
4.	හැඳින්වීම	04
	4.1 සමාගම් ව්‍යුහය	04
	4.2 නිෂ්පාදන වැඩබිම් සම්බන්ධ විස්තර	05
	4.3 නිෂ්පාදන තොරතුරු	06
	4.4 අලෙවිය	06
5.	යෝජිත අනාගත සංවර්ධන සැලැස්ම	07
	5.1 මෙම සංවර්ධන කටයුතුවල සැළකිය යුතු ප්‍රතිදානය	07-08
6.	මූල්‍ය සාරාංශය	09
7.	ප්‍රධාන මාණ්ඩලික නිළධාරීන්ගේ විස්තර	10
8.	සංවිධාන ව්‍යුහය	11
9.	අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව	12-13
10.	කොටස් හිමිවරුන් වෙත ස්වාධීන විගණක වාර්තාව	14-22
11.	විගණනය කරන ලද ගිණුම් 2023/2024	23-71

1. සභාපතිතුමාගේ ප්‍රකාශය - වාර්ෂික මහා සභා රැස්වීම 2023/2024 ජාතික ලුණු සමාගම

ජාතික ලුණු සමාගමේ වර්තමාන සභාපති වශයෙන් මම, සමාගමේ 2023/2024 වාර්ෂික මහා සභා රැස්වීමට ඔබව සාදරයෙන් පිළිගැනීමට ලැබීම ගැන ද, 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන වාර්ෂික වාර්තාව සහ ගිණුම් ප්‍රකාශය ඔබ වෙත ඉදිරිපත් කිරීමට ලැබීම ගැන ද සතුටට පත් වෙමි.

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ ජාතික ලුණු සමාගම රු.මිලියන 502 ක පිරිවැටුමක් සාක්ෂාත්කර කරගෙන ඇති අතර, වර්ෂයේ බදු ගෙවීමට පෙර ලාභය වශයෙන් රු.මිලියන 287 ක් වන අතර එය 2022/23 වසරවල උපයාගත් ලාභයට සාපේක්ෂව 48%ක වැඩිවීමකි. සමාගමේ වාර්ෂික නිශ්පාදන සහ විකුණුම් කාර්යයන් 2023/2024 වර්ෂය තුල දී විශිෂ්ඨ අභිවෘද්ධියක් පෙන්නුම් කරන අතර, වර්ෂය තුළ රාජ්‍ය බදු වශයෙන් සමාගම විසින් රු.මිලියන 89 ක මුදලක් ගෙවා ඇත. ශ්‍රී ලංකාවේ ලුණු කර්මාන්තය සක්‍රීය ලෙස සංවර්ධනය කිරීම හා තිරසාර ලෙස පවත්වාගෙන යාම සඳහා පහසුකම් සපයන්නා ලෙස කටයුතු කිරීමට සමාගමට හැකි වූ බව කොටස් හිමියන් වෙත මම සතුටින් දන්වා සිටිමි. 2023/2024 වර්ෂය තුළ දී ලබාගන්නා ලද කොටසක ඉපැයුම රු. 662 ක් විය. එය පෙර වර්ෂයට සාපේක්ෂව 41%ක වැඩිවීමකි.

2024.03.31 දින වන විට, වර්ෂය සඳහා අනුමත කරන ලද මුළු සේවක සංඛ්‍යාව 167 ක් විය. එකී දිනය වන විට සිටි ස්ථිර සේවක සංඛ්‍යාව 63 ක් වූ අතර, ඉතිරි සේවක සංඛ්‍යාව අවශ්‍යතාවය අනුව කොන්ත්‍රාත් සහ අනියම් වාරික පදනම මත බඳවා ගන්නා ලද සේවකයින්ගෙන් පුරවා ඇත. සෑම ස්ථරයකම සිටින සියලුම සේවකයින්ගේ පූර්ණ සහයෝගය අඛණ්ඩව අප වෙත ලැබෙන බව දන්වා සිටින්නේ සතුටිනි.

ජාතික ලුණු සමාගම අවසන් වෙළඳපොලේ පාරිභෝගික අවශ්‍යතා සපුරාලීමේ අරමුණින් “එලිපන්ට්පාස් මේස ලුණු” නමින් අතිරේක අගය එකතු කල නිෂ්පාදනය වෙළඳපලට ඉදිරිපත් කරමින්, සමාගමේම වටිනාකම පිළිවෙල මඟින් වෙළඳපලේ පැවතීම පුළුල් කරයි. තවදුරටත් එලිපන්ට්පාස් ලේවායේ නිෂ්පාදන හැකියාව විශාල කිරීමටත්, මන්නාරම හා එලිපන්ට්පාස් ලේවා දෙකෙහිම මෙහෙයුම් කාර්යය සාධනය වැඩිදියුණු කිරීමටත් කටයුතු කරමින් සිටී. අනාගතයේ ජාතික ලුණු සමාගම පසුබෑමකින් තොරව නිසියාකාරව තිරසාර ප්‍රගතියක් තහවුරු කිරීම සඳහා, අයහපත් කාලගුණික වෙනස්කම් සහ වෙළඳපල බලපෑම් ඇතුලු ලේවා මෙහෙයුම් වල අවධානම් සාධක දැක්වෙන ආකාරය මැනවින් අවධානයෙන් නිරීක්ෂණය කරයි. ඒ සමඟම ජාතික ලුණු සමාගමේ වර්තමාන පාලන මණ්ඩලය, කුරුන්වතිච් ලේවාය යථා තත්ත්වයට පත් කිරීමේ වැඩ පිළිවෙල සඳහා ඉහල ප්‍රමුඛත්වයක් ලබා දී, මේස ලුණු කර්මාන්ත ශාලාවේ සම්පූර්ණ ධාරිතාව යොදවමින් නිෂ්පාදන කටයුතු ඉටු කරවීම හා පරන්තන් රසායනික සමාගමට ස්ථාවර සම්පාදන සැපයීම තහවුරු කරයි.

කර්මාන්ත අමාත්‍යාංශය, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුව ද, මුදල් අමාත්‍යාංශය ද, රාජ්‍ය අධිකාරින් මෙන්ම ගනුදෙනුකරුවන් විසින් ද අප වෙත ලබා දෙන අඛණ්ඩ දිරිගැන්වීම් සහ සහයෝගය පිළිබඳව අපි සතුටට පත් වන්නෙමු.

ගයාන් වෙල්ලාල
සභාපති

2. සාමාන්‍යාධිකාරීතුමන්ගේ පණිවිඩය

ජාතික ලුණු සමාගම විසින්, 2023 අප්‍රේල් 01 දින සිට 2024 මාර්තු 31 දින දක්වා කාලය තුළ දී සිය කාර්යයන් අඛණ්ඩව සිදුකරගෙන යාම සහ ලාභ උපයා ගැනීම සම්බන්ධ වාර්ෂික මහා සභා රැස්වීමේදී මගේ පණිවිඩය ඉදිරිපත් කිරීමට ලැබීම මා ලද මහඟු අවස්ථාවකි.

පවත්නා මූල්‍ය වර්ෂයේදී මන්නාරම ලුණු ලේවාය සහ අලිමංකඩ ලුණු ලේවාය සාර්ථකව ක්‍රියාත්මක කිරීමට හැකි විය. 2015 ජනවාරි මස 15 දිනැති අංක 1897/ 15 දරණ අති විශේෂ ගැසට් නිවේදනයට අනුව, 2015 පෙබරවාරි මස සිට අලිමංකඩ ලුණු ලේවායේ පරිපාලන කටයුතු නැවතත් ජාතික ලුණු සමාගම යටතට පත්විය. මහා භාණ්ඩාගාරයේ මූල්‍ය සහයෝගය ඇතිව ජාතික ලුණු සමාගමේම අරමුදල් ආයෝජනය කරමින් සිදුකෙරෙන එහි ප්‍රතිසංස්කරණ කටයුතුවලින් 90% ක් අවසන් කර ඇති බව සතුටින් දන්වා සිටිමි.

2023/2024 වර්ෂය සඳහා අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටොන් 5500 ට සාපේක්ෂව, මෙම මූල්‍ය වර්ෂය තුළ දී මන්නාරම ලුණු ලේවායෙහි ලුණු මෙ.ටොන් 4099 ක් නිෂ්පාදනය කිරීමට අපගේ කණ්ඩායමට හැකි වූ අතර, අයවැයගත ප්‍රමාණය වූ මෙ.ටොන් 18,000 ට සාපේක්ෂව 2023/2024 වර්ෂය සඳහා ලුණු මෙ.ටොන් 10,676 ක් අලිමංකඩ ලුණු ලේවායෙහි නිෂ්පාදනය කිරීමට හැකි විය. අයහපත් කාලගුණික තත්වයන් හේතුවෙන් නිශ්පාදන අනුපාතය අඩු වී ඇත. ලුණු අලෙවිය මන්නාරම ලුණු ලේවායෙන් මෙ.ටොන් 2,386 ක් සහ අලිමංකඩ ලුණු ලේවායෙන් මෙ.ටොන් 9,688 ක් වශයෙන්, කි.ග්‍රෑ. 1 පැකට් කරන ලද සාමාන්‍ය ලුණු සහ අයඩින් මිශ්‍ර ලුණු, සහ කාර්මික ලුණු සහ කැට ලුණු යන ආකාරයට අලෙවිකරන ලද අතර, වර්ෂය සඳහා මුළු ශුද්ධ පිරිවැටුම රුපියල් මිලියන 502,573,939.00 කි. සකස් කරන ලද ගිණුම් අනුව මෙම වසර සඳහා බදු ගෙවීමට පෙර තථ්‍ය ලාභය රුපියල් 287,482,849.00 කි.

අපගේ සමාගම සාධාරණ මිලකට ලුණු විකිණීමෙන් පාරිභෝගිකයින්ට සේවා සැපයීම සිදු කරනවා පමණක් නොව, ආදායම් බදු ලෙස රුපියල් මිලියන 89.25 ක් රජයට ගෙවා ඇති අතර, තවද සාධාරණ ලාභාංශ ප්‍රමාණයක් භාණ්ඩාගාරයට ගෙවීම ද සිදු කරනු ලබන බව ඉතා ආඩම්බරයෙන් ප්‍රකාශ කර සිටිමි.

2026 වර්ෂය වන විට ශ්‍රී ලංකා වෙළඳපලින් 14% ක් සපයනු ලබන ප්‍රධාන ලුණු නිෂ්පාදකයා බවට ජාතික ලුණු සමාගම පත් කිරීමට කළමනාකරණය අරමුණු කර ඇත.

මෙම මූල්‍ය වර්ෂය තුළ දී සේවය කරන ලද කාර්ය මණ්ඩලය, ඉලක්ක සඳහා පුහුණු කිරීම, ඇගයීම, මූලික පහසුකම් සැපයීම, ප්‍රසාද දීමනා ගෙවීම යනාදී විවිධාකාර වූ ක්‍රියාකාරකම් මඟින් බලගන්වා ඇත.

අවසාන වශයෙන්, මෙම සමාගමේ සාර්ථකත්වය සඳහා ඔවුන්ගේ හෘදයාංගම දායකත්වයක් ලබා දීම වෙනුවෙන් මම කර්මාන්ත අමාත්‍යාංශයේ ගරු අමාත්‍යතුමන්ට සහ ලේකම්තුමාටත්, ආයතනයේ සභාපති, අධ්‍යක්ෂ මණ්ඩලය සහ මාගේ කාර්ය මණ්ඩලයටත් මාගේ ස්තූතිය ප්‍රකාශ කර සිටිමි.

එම්.ජේ. තුවාන් මන්සිල්
සාමාන්‍යාධිකාරී

3. සංස්ථාපිත තොරතුරු

සමාගමේ නම	ජාතික ලුණු සමාගම (රජය සතු සමාගමකි)
රේඛීය අමාත්‍යාංශය	කර්මාන්ත අමාත්‍යාංශය
ප්‍රධාන කාර්යාලය	561/3, ඇල්විටිගල මාවත ,කොළඹ.05
මන්නාරම ලුණු ලේවාය	ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම.
අලි මංකඩ ලුණු ලේවාය	A9 මාර්ගය, අලි මංකඩ, කිළිනොච්චි
සමාගමේ ලියාපදිංචි අංකය	[N(PBS)942] නව අංකය: PB 1078
කොටස් හිමිකරුවන්	මහා භාණ්ඩාගාරය
අධ්‍යක්ෂ මණ්ඩලය	01/04/2023 දින සිට 31/03/2024 දක්වා 1. ඩී.ආර්. අනුර බණ්ඩාර මහතා - සභාපති 2. එල්. පී. වැවලගේ මහතා – භාණ්ඩාගාර නියෝජිත 3. ඩබ්. එම්. එන්. ජයන්ත පුෂ්පකුමාර මහතා 4. ඩබ්. එම් ජානක ආර්. වික්‍රමසිංහ මහතා 5. ආර්. එම්. ශ්‍රීලාල් තිලකරත්න මහතා 6. සේපාල සෙනෙවිරත්න මහතා 7. එච්. එම්. ධම්මික කේ ප්‍රේමතිලක මහතා - 4.12.2023 දක්වා 8. එම්.එම්.එන්.ආර්.කේ. ගුණතිලක මහතා - 4.12.2023 දක්වා
නිරීක්ෂක	එස්. එන්. බාලසුබ්‍රමනියම් මහතා – නිරීක්ෂක - 2023 මැයි දක්වා
අධ්‍යක්ෂ මණ්ඩල ලේකම්	කෝපරේට් එෆයාර්ස් (ප්‍රයිවට්) ලිමිටඩ් - 2023 සැප්. දක්වා ඩබ්.එච්.ජේ.ඩබ්.ඩබ්. කුලවංශ - 2023 සැප්. සිට 2024 ජන. දක්වා එච්.එල්. විපුල සිල්වා - 2023 පෙබ. සිට
විගණක	රජයේ විගණකවරුන් ජාතික විගණන කාර්යාලය, ශ්‍රී ලංකාව
බැංකුකරු	ලංකා බැංකුව

4. හැඳින්වීම

4.1සමාගම් ව්‍යුහය

ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනය සම්බන්ධයෙන් දීර්ඝ ඉතිහාසයක් ජාතික ලුණු සමාගම සතුව ඇත. එම ආයතනය සාමාන්‍ය ලුණු, අයඩීන් ලුණු, කැට ලුණු සහ කාර්මික ලුණු නිෂ්පාදනය කරනු ලබයි. එහි ප්‍රධාන නිෂ්පාදන බිම් මන්නාරම සහ අලිමංකඩ (කිළිනොච්චි) යන ප්‍රදේශවල පිහිටා ඇති අතර, එහි පරිපාලන කාර්යාලය කොළඹ පිහිටා ඇත.

ලුණු දෙපාර්තමේන්තුව 1938 වර්ෂයේ දී ආරම්භ කර ඇති අතර, විවිධ වූ පරිපාලන අධිකාරීන් යටතේ පැවති එය අවසානයේ දී 2001 වර්ෂයේ සිට මාන්තායි සෝල්ට් ලිමිටඩ් ලෙස නම් කරන ලදුව 2021 ජූනි මාසයේ දී එය ජාතික ලුණු සමාගම ලෙස නැවත නම් කරන ලදී. වර්තමානයේ එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතේ ක්‍රියාත්මක වේ.

මෙම සමාගම විසින් නිෂ්පාදනය කරනු ලබන ලුණු දිවයිනේ අනෙකුත් ප්‍රදේශවලින් නෙලාගන්නා ලුණු හා සැසඳීමේ දී ගුණාත්මක බවින් ඉතාම ඉහල අගයක ඇති බව පිළිගැනේ. (එහි 96% ක් සෝඩියම් ක්ලෝරයිඩ් වේ). වර්තමානයේ මන්නාරම ලුණු ලේවායේ වර්ෂයකට සකස් නොකළ ලුණු මෙ.ටොන් 6,000 ක් නිශ්පාදනය කිරීමේ නිශ්පාදන ධාරිතාවයකින් යුක්ත වන අතර, අලිමංකඩ ලුණු ලේවායේ වාර්ෂික ලුණු නිශ්පාදනය කිරීමේ ධාරිතාවය ලුණු මෙ. ටොන් 18,000 ක් වේ.

ජාතික ලුණු සමාගම ස්වාභාවික සම්පත් උපයෝගීතා මධ්‍යස්ථානයක් ලෙස පමණක් නොව, මන්නාරම සහ කිලිනොච්චි දිස්ත්‍රික්කයන් හි අවදානමට ලක් වූ (පීඩිත) ජනතාවන්ට රැකියා අවස්ථාවන් ද ලබා දෙන මධ්‍යස්ථානයක් ලෙස ද ක්‍රියාත්මක වේ. මේ වන විට 63 දෙනෙකුගෙන් සමන්විත වන ස්ථිර කාර්ය මණ්ඩලයක් සහ කොන්ත්‍රාත් පදනම මත/ අනියම් සේවකයින් 7 දෙනෙකුගෙන් සමන්විත කාර්ය මණ්ඩලයක් සිටින අතර, දළ වශායන් පුද්ගලයින් 242 දෙනෙකුගෙන් සමන්විත වන තාවකාලික කාර්ය මණ්ඩලයක් ආයතනය විසින් සේවයේ යොදවා ඇත.

ජාතික ලුණු සමාගම, මහා භාණ්ඩාගාරයේ සහ අනෙකුත් රාජ්‍ය හා පෞද්ගලික අංශයේ ආයතනවල සාමාජිකයින්ගෙන් සැදුම්ලත් මණ්ඩලය විසින් පාලනය වන අතර, එය කර්මාන්ත අමාත්‍යාංශයේ විෂය පථය යටතට අයත් වේ. සමාගමේ නෛතික සහ වගකිවයුතු කාර්යයන් සම්බන්ධ අධීක්ෂණ කටයුතු සහ පහසුකම් සැපයීමේ කටයුතු අමාත්‍යාංශයේ සංස්ථාපිත අංශය විසින් සිදු කරනු ලබයි. එය රාජ්‍ය ව්‍යාපාරයක් බැවින් 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ සීමාසහිත සමාගමක් ලෙස සමාගම් නීති රීති වලට අනුකූලව ලියාපදිංචි කර ඇත. මේ අතර අගය එකතු කළ නිෂ්පාදනයන් හී ගුණාත්මකභාවය සහතික කිරීම සඳහා මෙම ආයතනය ශ්‍රී ලංකා

ප්‍රමිති ආයතනය විසින් සහතික කරනු ලැබේ. එසේම සමාගම රජයේ විගණකවරුන් විසින් විගණනය කරනු ලැබේ.

<u>සමාගමේ ඉතිහාස තොරතුරු</u>

වර්ෂය		**Name of Institute**
සිට	**දක්වා**	
1938	1965	ලුණු දෙපාර්තමේන්තුව
1966	1990	ශ්‍රී ලංකා ජාතික ලුණු සංස්ථාව
1991	1996	ලංකා සෝල්ට් ලිමිටඩ්
1997	/2001 සැප් දක්වා	මන්නාරම දිසාපති යටතේ මන්නාරම ලුණු ලේවාය
/2001 ඔක්.	2021 ජූනි දක්වා	මාන්තායි ලුණු සමාගම (උතුරු පළාතේ පිහිටි ලුණු ලේවායන්)
2021 ජූනි	මේ දක්වා	ජාතික ලුණු සමාගම (උතුරු පළාතේ පිහිටි ලුණු ලේවායන්)

දැක්ම



ව්‍යාපාරයේ ස්වභාවය අනුව සමාගම පහත පරිදි දැක්මකින් යුක්ත ය.

"රසායනික හා වෙනත් ක්‍රියාවලීන් හා සම්බන්ධ ස්වාභාවික සම්පත් ගවේෂණය කිරීමෙන් උතුරු පළාතේ ලුණු ආශ්‍රිත ව්‍යවසායන් සංවර්ධනය කිරීම සහ එමඟින් ජනතාවගේ ජීවන තත්ත්වය නංවාලීම".

මෙහෙවර

සමාගමේ මෙහෙවර පහත පරදි වේ .

"ලුණු ලේවායන් මෙහෙය වීම, ලුණු නිෂ්පාදනය, අගය එකතු කිරීම සහ ලුණු සහ අතුරු නිෂ්පාදන අලෙවි කරණය"

<u>4.2 නිෂ්පාදන වැඩ බිම් සම්බන්ධ විස්තර</u>

අ) මන්නාරම ලුණු ලේවාය

මන්නාරම ලුණු ලේවායේ සම්පූර්ණ නිෂ්පාදන භූමි ප්‍රමාණය අක්කර 163 කි. වාර්ෂික ලුණු නිෂ්පාදනය ආසන්න වශයෙන් මෙ.ටො. 6000 ක් වන අතර එය ශ්‍රී ලංකාවේ මුළු ලුණු නිෂ්පාදනයෙන් 3.3% ක් වේ. ලාභ ඉපැයීමේ ආයතනයක් ලෙස මෙම ආයතනය තම ලාභය මඟින් සිය කාර්ය මණ්ඩල වැටුප් ගෙවීම හා සුභ සාධන කටයුතු සමඟ ම ආයතනයේ යම් සංවර්ධන හා නඩත්තු කටයුතු සිදු කරයි.

ආ) අලිමංකඩ ලුණු ලේවාය

ලුණු ලේවායේ සම්පූර්ණ රක්ෂිත භූමි ප්‍රමාණය අක්කර 750ක් වන අතර ඉන් අක්කර 550ක් ක්‍රියාත්මක වේ. අලිමංකඩ ලුණු ලේවායෙහි සාමාන්‍ය වාර්ෂික නිෂ්පාදන ධාරිතාව දළ වශයෙන් 2026 වර්ෂයේ දී මෙ.ටොන් 23,000ක් අපේක්ෂා කෙරේ. මෙම ලුණු ලේවායේ නවීකරණ කටයුතුවලින් 90% ක් දක්වා සාර්ථකව නවීකරණය කර ඇති අතර, 2016 වසරේ සිට නිශ්පාදන ක්‍රියාවලිය ආරම්භ කරන ලද අතර 2019/2020 වන විට මෙ.ටොන් 16,089 ක නිශ්පාදනයක් සාක්ෂාත් කරගෙන ඇත.

වර්තමානයේ මෙම ලුණු ලේවායන් දෙකෙහිම සාමාන්‍ය ලුණු නිශ්පාදන කරන අතර, නුදුරු අනාගාතයේ දී ම මේස ලුණු යන්ත්‍රාගාර ස්ථාපිත කිරීම මඟින් අගය එකතු කිරීමේ ක්‍රියාවලියක් මහා පරිමාණයෙන් සිදු කිරීමට සැලසුම් කරමින් පවතී.

4.3 නිශ්පාදන විස්තර

ලුණු ලේවාය	2018/2019	2019/2020	2020/2021	2021/2022	2022/2023	2023/2024
මන්නාරම	6249	6683	2786	2378	2245	4099
අලි මංකඩ	10314	16089	8496	5283	6288	10,676
එකතුව	**16,563**	**22,772**	**11,282**	**7661**	**8533**	**14,775**

4.4 අලෙවිය

වර්ෂය	අලෙවිය(මෙ.ටො.)	ආදායම(මිලි.) රු.
2016/2017	3337	93.8
2017/2018	6094	83.7
2018/2019	16,146	155.38
2019/2020	13,063	103.47
2020/2021	23,484	201.56
2021/2022	14,312	249.05
2022/2023	8,866	343.14
2023/2024	12,074	502.57

5. යෝජිත අනාගත සංවර්ධන සැලැස්ම

අ) මන්නාරම ලුණු ලේවාය

1) සමාගම පැයට මෙ.ටොන් 02 ක් නිපදවන ස්ඵටික ලුණු යන්ත්‍රාගාරය සාර්ථකව ස්ථාපනය කර ඇත. මේ වන විට ඇසුරුම් කිරීමේ කටයුතු ආරම්භ කර ඇති අතර, දිස්ත්‍රික්කය තුළ බෙදාහරින්නන් සහ තොග වෙළඳුන් මගින් විකිණීම සිදු කරනු ලබයි.

   සමාගම වසරකට මෙට්‍රික් ටොන් 3000 ක් සඳහා ස්ඵටික ලුණු පැකට් කිරීමේ ක්‍රියාවලිය පුළුල් කිරීමේ කටයුතුවල නිරතව සිටින අතර, ඒ අනුව අලෙවිකරණ සහ විකුණුම් ඒකකයක් සංවර්ධනය කරමින් පවතී.

   තවද, මේස ලුණු යන්ත්‍රාගාරයක කොටසක් සවි කිරීම මඟින් යන්ත්‍රාගාරය වැඩිදියුණු කර මේස ලුණු නිෂ්පාදනය කිරීමට සැලසුම් කර ඇත.

2) මන්නාරම ලුණු ලේවායේ පරිපාලන කටයුතු සඳහා කාර්යාල ගොඩනැගිල්ල ඉදිකිරීමට නියමිතය.

3) මන්නාරම ලුණු ලේවාය සඳහා ක්ෂේත්‍ර කාර්යාලය ඉදිකිරීමට නියමිතය.

ආ) අලි මංකඩ ලුණු ලේවාය

1) අක්කර 650 ක භූමි ප්‍රදේශයක නිශ්පාදන කටයුතු ආරම්භ කිරීම සඳහා පූර්ණ ධාරිතාවයෙන් යුතු ලුණු ලේවාය පුනරුත්තාපනය කිරීම.
2) පැයකට මෙ.ටොන් 05ක ධාරිතාවයෙන් යුත් මේස ලුණු කම්හලක් ස්ථාපනය කිරිමට කටයුතු කරමින් පවතී..

5.1 **මෙම සංවර්ධන කටයුතුවල සැළකිය යුතු ප්‍රතිදානය.**

- **වෙළඳපොල ව්‍යාප්තිය සහ ව්‍යාපාර ශක්‍යතාව**

  නව යන්ත්‍රාගාර මඟින් නිපදවන ස්ඵටික ලුණු සහ කුඩු කළ ලුණු නිශ්පාදනය සහ අලෙවිය, වෙළඳපළ ව්‍යාප්ත කිරීමට සහ පුළුල් කිරීමට උපකාරී වන අතර, එමඟින් වෙළඳපල තුළ සමාගමේ ශක්‍යතාව සහතික කෙරේ.

- **තොග තබාගැනීමේ කාලය අඩු කිරීම**

  නිෂ්පාදන ධාරිතාව වැඩි කිරීම සහ අලෙවිය කඩිනම් කිරීම මඟින් තොග ගබඩා කිරීමේ සහ රඳවා තබා ගැනීමේ කාල සීමාවන් අඩු වන අතර එයින් තොග ප්‍රවාහය සහ මෙහෙයුම් කාර්යක්ෂමතාව වැඩි වේ.

- **රැකියා අවස්ථා නිර්මාණය කිරීම**

    නිෂ්පාදනය සහ බෙදාහැරීම පුළුල් කිරීම මත නව රැකියා අවස්ථා නිර්මාණය වන අතර, එය ප්‍රාදේශීය ආර්ථික සංවර්ධනයට ද දායක වේ.

- **සේවක සුභසාධනය වැඩි කිරීම**

    වැඩිවන ලාභය මගින් සේවකයින්ට වැඩි සුභසාධන පහසුකම් සහ ප්‍රතිලාභ ලබා දීමට හැකියාව සලසයි. එමගින් වැඩි උද්‍යෝගශීලී සහ තෘප්තිමත් සේවක බලකායක් බිහිවීමට දායක වේ.

- **තත්ත්ව ප්‍රමිතීන්ට අනුකූල වීම**

    නව කර්මාන්තශාලාව, ශ්‍රී ලංකා ප්‍රමිතීන් ආයතනය (SLSI) විසින් නියම කරන ලද ප්‍රමිතීන්ට අනුකූලව ක්‍රියාත්මක වන අතර, එය නිෂ්පාදන ගුණාත්මකත්වයේ ස්ථිරතාවය හා නියාමන අනුකූලතාවය සහතික කරයි.

- **ප්‍රජා සෞඛ්‍යයට දායක වීම**

    ග්‍රාමීය වෙළඳපොලේ නිෂ්පාදන සාධාරණ මිලකට ලබා දීම මගින් මහජන සෞඛ්‍යයට සහාය වෙමින් අයඩින් ඌනතා ආබාධවලට එරෙහිව සටන් කිරීම සඳහා දායක වේ

- **රජයට ආදායම වැඩිවීම**

සමාගමේ අඛණ්ඩ වර්ධනය මගින් අයවැය තුළට වැඩි බදු ආදායමක් ගෙන එන අතර, එහිදී අතිරේක අගය එකතු කළ බද්ද (VAT), ජාතික ව්‍යාපාර බද්ද (NBT) සහ අර්ථකාශයට ගෙවනු ලබන වැදගත් ලාභාංශ අත්‍යවශ්‍ය කොටසක් වේ. මෙම ආදායම ජාතික සංවර්ධන වැඩසටහන් සඳහා පදනමක් සැපයීමෙන් තවදුරටත් ජනතාවට ප්‍රයෝජන ලබා දීමට උපකාරී වේ.

6. මූල්‍ය සාරාංශය

මාර්තු 31 දිනෙන් අවසන් වන වර්ෂය සඳහා	ඒකක	2023/2024	2022/2023	2021/2022	2020/2021	2019/2020
නිශ්පාදනය	මෙ.ටො.	14,775	8,533	7,661	11,283	22,772
අලෙවිය	මෙ.ටො	12,074	8,866	14,312	23,484	13,063
ආදායම	රු..	502,573,939	343,140,970	249,051,040	201,568,231	103,473,982
දළ ලාභය	රු.	285,041,080	175,379,118	132,998,887	72,039,111	19,170,216
ශුද්ධ ලාභය	රු.	198,229,496	134,806,255	109,940,047	60,170,921	12,796,333
ශුද්ධ වත්කම්						
ජංගම නොවන මුළු වත්කම්	රු.	318,550,188	141,149,360	132,385,413	276,402,270	149,768,539
මුළු ජංගම වත්කම්	රු.	504,456,962	442,553,826	306,829,638	74,059,721	146,737,592
අඩු කල ජංගම නොවන වගකීම්	රු.	(30,110,766)	(26,671,517)	(11,901,537)	(10,003,783)	(9,296,086)
අඩුකළ ජංගම වගකීම්	රු.	(110,954,380)	(63,356,504)	(27,177,932)	(18,712,426)	(12,657,428)
		681,942,004	**493,675,165**	**400,135,582**	**321,745,782**	**274,552,617**
කොටස් හිමියන්ගේ අරමුදල්						
නිකුත් කල කොටස් ප්‍රාග්ධනය	රු.	30,000,000	30,000,000	30,000,000	30,000,000	30,000,000
සංචිත	රු.	651,942,003	463,675,165	370,135,582	291,745,782	244,552,617
		681,942,003	493,675,165	400,135,582	**321,745,782**	**274,552,617**
රජයට ආදායම්						
ආදායම් බදු	රු.	89,253,353	58,065,641	21,051,885	9,997,609	498,090
කොටසක් සඳහා ඉපයීම	රු.	**662**	**470**	**366.46**	**200.56**	**42.65**

7. ප්‍රධාන මාණ්ඩලික නිලධාරීන්ගේ විස්තර

නම	තනතුර	සුදුසුකම්	නැෂනල් සොල්ට් ලිමිටඩ් හි සේවා කාලය
එම්.ජේ. තුවාන් මන්සිල් මහතා	සාමාන්‍යාධිකාරී	BSc. MBA, Dip in HRM, Dip in Eng. AAT-1	2014 සැප්තැම්බර් මස සිට
ආර්.වී. විනෝහරන් මහතා	මූල්‍ය කළමනාකරු	ACMA	2017 ජනවාරි මස සිට
ඒ.කිෂෝතරන් මහතා	කළමනාකරු- ලුණු ලේවාය	B.Sc /PGD	2008 අප්‍රේල් මස සිට
ඩී.ජේ.එච්.එස්. පුෂ්පකුමාර මහතා	සහකාර මූල්‍ය කළමනාකරු	CASL (Inter)	2019 පෙබරවාරි මස සිට
එම්.එෆ්. ෆහිසාල් මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	Dip in Mec Eng.	2010 නොවැම්බර් මස සිට
එස්.ජේ. ජිනදාස මිය	අභ්‍යන්තර විගණන නිලධාරී	G.C.E. A/L AAT satge 1& 2 & Dip in HR	2012 අප්‍රේල් මස සිට
ඊ. විජයාන් මයා	සහකාර කළමනාකරු- ලුණු ලේවාය	G.C.E. Advance level	2002 අප්‍රේල් මස සිට
ආර්.එම්.එම්.සී. රත්නායක මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	NVQ Level- 05 10 years Experience	2023 මැයි. මස 15 සිට
වි. සුයන්තන් මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	BSc.	2023 ජූනි මස 01 සිට
ඩබ්.ඒ.කේ.වී.සී. වන්නිආරච්චි මහතා	කළමනාකරු- පිරිවැය	ICAL- Intermediate Level, AAT Passed Finalist	2023 ජූනි මස 06 සිට
ගයන්ත තිලකරත්න මහතා	කළමනාකරු -ලුණු ලේවාය	BSc.	2023 අගෝ. මස 07 සිට
ජී.එන්.එස්. ප්‍රනාන්දු මහතා	කළමනාකරු- පරිපාලන	BBA	2023 සැප්. 1 සිට
ඩබ්.එච්.අයි.ආර්.ඩී. සිල්වා	කළමනාකරු- මූල්‍ය	ICAL- Intermediate Level	2023 නොවැ. මස 02 සිට
එස්.එම්. සන්ෆර් මහතා	සහකාර කළමනාකරු - ලුණු ලේවාය	BSc.	2023 නොවැ. මස 30 සිට

8. සංවිධාන ව්‍යුහය



සභාපති
අධ්‍යක්ෂ මණ්ඩලය
සාමාන්‍යාධිකාරී
HM 1-3
නියෝජ්‍ය සාමාන්‍යාධිකාරී
-01
HM 1-1
මූල්‍ය කළමනාකරු -01 MM 1-1
පිරිවැය ගිණුම් කළමනාකරු - 1 MM-1
අලෙවි කළමනාකරු MM 1-1
කළමනාකරු ලුණු ලේවාය 02 MM 1-1
පරිපාලන කළමනාකරු 01 MM 1-1
අභ්‍යන්තර විගණක MM1-1 - 01
ස. මූල්‍ය කළමනාකරු -01 JM1-1
ස. අලෙවි කළමනාකරු 01
ස. ත. පාලන කළමනාකරු ලුණු ලේවාය 01
ස. කළමනාකරු ලුණු ලේවාය -05
ස. පරිපාලන කළමනාකරු - 01 JM1-1
අභ්‍යන්තර විගණන නිලධාරී -01 JM1-1
තාක්ෂණ නිලධාරී 01
ලුණු ලේවා නිලධාරි (07) MA 2-1
ලබ්ධා භාරකරු (03) MA2-1
කළමනාකරණ සහකාර (07 MA 1-1
කළමනාකරණ සහකාර (04) MA 1-1
ආරක්ෂක ස්ථානභාර නිලධාරි (02) MA 1-2
කළමනාකරණ සහකාර (7) MA 1-1
කළමනාකරණ සහකාර (01) MA 1-1
ප්‍රාථමික මට්ටම පුහුණු (23)
රියදුරු 06
කාර්මික ශිල්පී -2
විදුලි කා. ශිල්පී -3
අධික්ෂක - 8
තාක්ෂණ ශිල්පී 2
((විද්‍යාගාර සහ වාරිමාර්ග)
කාර්මික ශිල්පී - 2
(සිවිල්)
PL-3
අධ්‍යක්ෂ (04)
ප්‍රාථමික මට්ටම අඩ පුහුණු (14)
ස. කාර්මික ශිල්පී -03
ස. ගබඩා පාලක 03
පොම්ප ක්‍රියාකරු - 08
PL-2
ප්‍රාථමික මට්ටම නුපුහුණු (75)
කාර්යාල සහයක - 6
කම්කරු -61
ආරක්ෂක -08
PL-1

9. අධ්‍යක්ෂවරුන්ගේ වාර්තාව

සමාගමේ අධ්‍යක්ෂවරු විසින් 2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විගණනය කරන ලද ශේෂ පත්‍රය සහ ආදායම් ප්‍රකාශණය සමඟ ඔවුන්ගේ වාර්තාව ද මේ සමඟ ඉදිරිපත් කරති.

ප්‍රධාන ක්‍රියාකාරකම්

සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම් වූයේ ලුණු නිෂ්පාදනය හා අලෙවියයි.

මූල්‍ය සාරාංශය

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ මූල්‍ය වර්ෂය

	Rs.
මුළු පිරිවැටුම	502,573,939.00
දළ ලාභය	285,041,080.00
බදු පෙර ලාභය	287,482,849.00
කාල පරිච්ඡේදය සඳහා ශුද්ධ ලාභය / (බදු ගෙවීමෙන් පසු)	198,229,496.00
කොටසක ඉපයීම	**662**

<u>අධ්‍යක්ෂවරු.</u>

2023/24 වර්ෂය තුළ සමාගමේ අධ්‍යක්ෂවරුන් ලෙස ක්‍රියා කළ නිලධාරීන් පහත දැක්වේ.

01/04/2023 දින සිට 31/03/2024 දක්වා

1. ඩී.ආර්. අනුර බණ්ඩාර මහතා - සභාපති
2. එල්. පී. වැවලගේ මහතා – භාණ්ඩාගාර නියෝජිත
3. ඩබ්. එම්. එන්. ජයන්ත පුෂ්පකුමාර මහතා
4. ඩබ්. එම් ජානක ආර්. වික්‍රමසිංහ මහතා
5. ආර්. එම්. ශ්‍රීලාල් තිලකරත්න මහතා
6. සේපාල සෙනෙවිරත්න මහතා
7. එච්. එම්. ධම්මික කේ ප්‍රේමතිලක මහතා - 4.12.2023 දක්වා
8. එම්.එම්.එන්.ආර්.කේ. ගුණතිලක මහතා - 4.12.2023 දක්වා

<u>අධ්‍යක්ෂවරුන්ගේ කොටස් හිමි කාරිත්වය</u>

අධ්‍යක්ෂවරුන් සමාගමේ එකම කොටසකටවත් හිමිකම් නොකියයි.

<u>කොන්ත්‍රාත්තුවලින් අධ්‍යක්ෂවරුන්ට ලැබෙන පොලිය</u>

සමාගම සමඟ ඇති කිසිදු කොන්ත්‍රාත්තුවකින් අධ්‍යක්ෂවරුන්ට ඍජු හෝ වක්‍ර පොලියක් නොලැබේ.

<u>විගණකවරු</u>

සමාගමේ වර්තමාන විගණක වරයා වන්නේ ශ්‍රී ලංකාවේ ජාතික විගණන කාර්යාලය යි.

අධ්‍යක්ෂ මණ්ඩලයේ නියමය පරිදි

සමාගමේ ලේකම්

විගණනය කරන ලද ගිණුම්
2023/2024

මගේ අංකය / எனது இல. / My No. IMT/A/NSL/2023-2024/ FA 08
ඔබේ අංකය / உமது இல. / Your No.
දිනය / திகதி / Date 2024 දෙසැම්බර් 30 දින

සභාපති,

ජාතික ලුණු සමාගම

සී/ස ජාතික ලුණු සමාගමේ 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන සහ වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳව 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 වන වගන්තිය ප්‍රකාරව විගණකාධිපති වාර්තාව

---

1. මූල්‍ය ප්‍රකාශන

1.1 තත්ත්වාගණනය කළ මතය

සී/ස ජාතික ලුණු සමාගමේ 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්ති වලට අදාල තොරතුරු ද ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2024 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මාගේ වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලැබේ.

මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, සමාගමේ මූල්‍ය ප්‍රකාශන තුළින් 2024 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල, ශ්‍රී ලංකාව இல. 306/72, பொல்துவ வீதி, பத்தரமுல்லை, இலங்கை. No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 +94 11 2 88 72 23 ag@auditorgeneral.gov.lk www.naosl.gov.lk

1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

(අ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 13.4 ඡේදය ප්‍රකාරව සමාගමේ තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන අගයන්ගෙන් වඩා අඩු අගයට මැනිය යුතු වුවද රු.50,428,449 ක් වූ අවසාන තොග ශේෂය අයවැයගත ඒකක පිරිවැයට අගය කර තිබුණි.

(ආ) දේපළ පිරියත හා උපකරණ පිළිබඳ කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 17.15 C ඡේදය ප්‍රකාරව ප්‍රත්‍යාගණන ලාභය හෝ අලාභය ගණනය කිරීමේ දී ප්‍රත්‍යාගණිත දිනට එම වත්කම් වල පැවතිය යුතුව තිබූ ධාරණ අගය ගණනය කොට ධාරණ අගය ඉක්මවා යන වටිනාකම ප්‍රත්‍යාගණන ලාභය ලෙස ගිණුම්ගත කළ යුතු වුවත් 2020 වර්ෂයේ දී රජයේ ප්‍රදානයක් ලෙස සමාගම වෙත පවරා දෙන ලද ගිණුම්ගත නොකරන ලද වටිනාකම රු.6,828,395 ක් වූ වත්කම් ප්‍රාග්ධන ප්‍රදාන ලෙස හඳුනා නොගෙන 2023 අගෝස්තු 24 දින රු.4,909,500 කට අගය කර එම ප්‍රත්‍යාගණිත වටිනාකම ප්‍රත්‍යාගණන සංචිතය හා වත්කම් යටතේ ගිණුම්ගත කර තිබුණි.

(ඇ) සමාගමේ ප්‍රධන කාර්යාලය පවත්වාගෙන යන ගොඩනැගිල්ල සඳහා ගෙවිය යුතු කුලී ලෙස රු.1,800,000 ක වියදමක් ගිණුම්වල පෙන්වා තිබුණ ද එම වටිනාකම තහවුරු කිරීම සඳහා සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

(ඈ) කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියේ 28.24 ඡේදය ප්‍රකාරව නිර්වචිත ප්‍රතිලාභ සැලසුමේ පිරිවැය හඳුනා ගැනීමේ දී කාලපරිච්ඡේදය සඳහා වන ආයුගණක ලාභය / අලාභය ආදායම් ප්‍රකාශනයේ හෝ වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ හඳුනාගත යුතු නමුත් සමාගම විසින් රු. 411,199 ක් වන ආයුගණක අලාභය ආදායම් ප්‍රකාශයේ වියදමක් ලෙස ද, වෙනත් විස්තීර්ණ ආදායම් යටතේ ලාභයක් ලෙසද හඳුනාගෙන තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ මුළු විස්තීර්ණ ආදායම රු.411,199 කින් අධිගණනය වී තිබුණි.

(ඉ) රු.19,302,311 ක් වූ සමාලෝචිත වර්ෂයේ ආරම්භක තොගය රු.16,939,123 ක් ලෙස මූල්‍ය ප්‍රකාශන වල දක්වා තිබීමෙන් වර්ෂයේ ලාභය රු.2,363,188 කින් අධිගණනය වී තිබුණි.

(ඊ) සමාලෝචිත වර්ෂයට අදාල ස්ථාවර තැන්පතු පොළී ආදායම රු.56,736,709 ක් වුවද, එය රු.58,216,559 ක් ලෙස රු.1,479,850 කින් වැඩියෙන් දැක්වීම නිසා වර්ෂයේ ලාභය එම අගයෙන් අධිගණනය වී තිබුණි.

(ඇ) දේපළ පිරියත උපකරණ යටතේ දක්වා ඇති යටිතල පහසුකම් සංවර්ධන පිරිවැය සඳහා සියයට 15 ක් වූ ක්ෂය අනුපාතය සියයට 15.4 ක් ලෙස ගෙන ක්ෂය ගණනය කිරීම හේතුවෙන් ක්ෂය වියදම රු.385,370 කින් වැඩියෙන් හා වත්කම් එම වටිනාකමින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) මූල්‍ය ප්‍රකාශනවල සඳහන් ආදායම් සංචිත හා වෙළඳ සහ වෙනත් ගෙවිය යුතු ශේෂ අගයන්ගේ එකතු වටිනාකම රු. 561,805,418 ක් වුවද ඊට අදාල සටහන් අනුව එහි එකතු වටිනාකම රු. 562,363,442 ක් වීමෙන් රු.558,024 ක වෙනසක් නිරීක්ෂණය විය.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

1.3 සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් අනෙකුත් තොරතුරු.

මෙම විගණන වාර්තාවේ දිනට පසුව මට ලබා දීමට බලාපොරොත්තු වන සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාවේ ඇතුළත් කර ඇති නමුත් මූල්‍ය ප්‍රකාශන සහ ඒ පිළිබඳව වූ මගේ විගණන වාර්තාවේ ඇතුළත් නොවන තොරතුරු, අනෙකුත් තොරතුරු යන්නෙන් අදහස් වේ . මෙම අනෙකුත් තොරතුරු සඳහා කළමනාකරණය වගකිව යුතුය.

මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් වූ මගේ මතයෙන් අනෙකුත් තොරතුරු ආවරණය නොකරන අතර මම ඒ පිළිබඳ කිසිදු ආකාරයක සහතිකවීමක් හෝ මතයක් ප්‍රකාශ නොකරමි.

මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මගේ විගණනයට අදාළව, මගේ වගකීම වන්නේ ඉහත හඳුනාගත් අනෙකුත් තොරතුරු ලබා ගත හැකි වූ විට කියවීම සහ එසේ කිරීමේදී අනෙකුත් තොරතුරු මූල්‍ය ප්‍රකාශන සමඟ හෝ විගණනයේදී හෝ වෙනත් ආකාරයකින් ලබාගත් මගේ දැනුම අනුව ප්‍රමාණාත්මක වශයෙන් නොගැලපෙනවාද යන්න සලකා බැලීමයි.

සමාගමේ 2023/2024 වාර්ෂික වාර්තාව කියවන විට, එහි ප්‍රමාණාත්මක වරදවා දැක්වීම් ඇති බව මම නිගමනය කළහොත්, නිවැරදි කිරීම සඳහා පාලනය කරන පාර්ශවයන් වෙත එම කරුණු සන්නිවේදනය කළ යුතුය. තව දුරටත් නිවැරදි නොකළ වරදවා දැක්වීම් තිබේ නම්, ඒවා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් යථා කාලයේදී පාර්ලිමේන්තුවේ සභාගත කරනු ලබන වාර්තාවට ඇතුළත් කරනු ඇත.

1.4 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන කුඩා හා මධ්‍යම පරිමාණ ව්‍යවසායන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

1.5 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම්

කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.
- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය, ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.
- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරමි.

2. වෙනත් නෛතික හා නියාමන අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 2007 අංක 7 දරන සමාගම් පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුලත් වේ .

2.1.1 මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර 2007 අංක 7 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (අ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවන් අනුව, විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු සහ පැහැදිලි කිරීම් මා විසින් ලබාගන්නා ලද අතර,

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන ආකාරයට නිසි මූල්‍ය වාර්තා සමාගම පවත්වාගෙන ගොස් තිබුණි.

2.1.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

2.1.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඈ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව මාගේ වාර්තාවේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම කොටසේ දක්වා ඇති 1.2 (ඉ) හි සඳහන් නිරීක්ෂණය හැර ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

2.2 අනුගමනය කරන ලද ක්‍රියාමාර්ග සහ ලබා ගන්නා ලද සාක්ෂි මත හා ප්‍රමාණාත්මක කරුණුවලට සීමා කිරීම තුල, පහත සඳහන් ප්‍රකාශ කිරීමට තරම් කිසිවක් මාගේ අවධානයට ලක් නොවීය.

2.2.1 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඇ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ පාලක මණ්ඩලයේ යම් සාමාජිකයෙකුට සමාගම සම්බන්ධව යම් ගිවිසුමක් සම්බන්ධයෙන් සෘජුව හෝ අන්‍යාකාරයකින් සාමාන්‍ය ව්‍යාපාරික තත්ත්වයෙන් බැහැරව සම්බන්ධයක් ඇති බව.

2.2.2 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඊ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව පහත සඳහන් නිරීක්ෂණ හැර යම් අදාල ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානවලට අනුකූල නොවන ලෙස ක්‍රියා කර ඇති බව.

නීතිරීති / විධානයට යොමුව	නිරීක්ෂණ
(අ) 2021 නොවැම්බර් 16 දිනැති අංක 01/2021 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය මගින් හඳුන්වා දෙන ලද රජය සතු ව්‍යවසායන් සඳහා වන මෙහෙයුම් අත්පොතෙහි 6.6 ඡේදය	සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2024 සැප්තැම්බර් 27 දින එනම් මාස 04 ක ප්‍රමාදයකින් පසු විගණනයට ඉදිරිපත් කරන ලද අතර මෙම වාර්තාවේ දිනය දක්වාම වාර්ෂික වාර්තාවේ කෙටුම්පතක් විගණනයට ඉදිරිපත් නොකරන ලදී.
(ආ) 2020 ජනවාරි 27 දිනැති අංක PED 01/2020 දරන මුදල්,	ක්‍රියාකාරී අධ්‍යක්ෂකවරුන් නව බඳවා ගැනීම් ලෙස පත් නොකළ යුතු වුවද 2023 අප්‍රේල් 11 වන දින

	ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශ චක්‍රලේඛයේ 2 වන ඡේදය	සිට සමාගමට විධායක අධ්‍යක්ෂකවරයකු බඳවාගෙන සමාලෝචිත වර්ෂය තුළ රු.1,597,896ක් වැටුප් හා දීමනා ලෙස භාණ්ඩාගාර අනුමැතියකින් තොරව ගෙවා තිබුණි.
(ඇ)	2022 දෙසැම්බර් 21 දිනැති අංක PED 08/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය	සේවකයින්ට ඉතිරි කර ගත් නිවාඩු මත දීමනා ගෙවීමේ දී රාජ්‍ය ව්‍යාපාරයේ සේවකයින්ට හිමි නිවාඩු 1954 අංක 19 දරන සාප්පු හා කාර්යාල සේවක පනතේ විධිවිධානයන්ට අනුකූල විය යුතු අතර එකී රාජ්‍ය ව්‍යාපාරය ප්‍රාග්ධන හා / හෝ පුනරාවර්තන වියදම් සඳහා මහා භාණ්ඩාගාරයෙන් අරමුදල් ලබා නොගත යුතුය. එසේ වුව ද එම කොන්දේසි වලට පටහැනිව වාර්ෂිකව සේවකයින්ට නිවාඩු 42 ක් ලබා දී තිබිය දී හා සමාගමට රු.මිලියන 100 ක ප්‍රාග්ධන ප්‍රදානයක් සමාලෝචිත වර්ෂයේ දී භාණ්ඩාගාරයෙන් ලබා දී තිබිය දී ඉතිරි කර ගත් නිවාඩු මත දීමනා ලෙස ස්ථිර නිලධාරීන් 59 ක් සඳහා රු. 764,073 ක් ගෙවා තිබුණි.
(ඇ)	2024 පෙබරවාරි 28 දිනැති අංක PED 01/2024 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2 ඡේදය හා 2022 අගෝස්තු 8 දිනැති අංක PED 04/2022 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 2.5 ඡේදය	භාණ්ඩාගාර අනුමැතියකින් තොරව අධ්‍යක්ෂ මණ්ඩල අනුමැතියෙන් නිලධාරීන් 402 ක් සඳහා රු.28,510,500 ක පැමිණීමේ දීමනාවක් හා සභාපතිවරයාගේ නවාතැන් පහසුකම් සඳහා රු.339,643 ක වියදමක් සමාලෝචිත වර්ෂයේදී දරා තිබුණි.

2.2.3 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (උ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ බලතල , කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූල නොවන ලෙස කටයුතු කර ඇති බව.

2.2.4 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 12 (ඌ) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව සමාගමේ සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ අදාළ නීතිරීති වලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර නොමැති බව

2.3 වෙනත් කරුණු

(අ) 2024 පෙබරවාරි 28 දින විගණනය විසින් අලිමංකඩ ලුණු ලේවායේ සිදු කරන ලද තොග භෞතික පරීක්ෂාව අනුව ශේෂය හා එදිනට නිෂ්පාදන ලේඛන අනුව ශේෂය අතර රු.13,548,600ක වටිනාකමැති මෙට්‍රික් ටොන් 408.4ක (දළ වශයෙන්) තොග ඌණතාවයක් නිරීක්ෂණය විය.

(ආ) සමාගම 2022/2023 වර්ෂය සඳහා ස්ථිර නොවන සේවකයින් 191 කට රු.1,499,719 ක ප්‍රසාද දීමනාවක් සමාලෝචිත වර්ෂය තුළ ගෙවා තිබුණ ද ඊට අදාළ භාණ්ඩාගාර අනුමැතිය විගණනය වෙත ඉදිරිපත් නොවුණි.

(ඇ) උතුරු හා නැගෙනහිර පළාත්වල පැවති යුධමය වාතාවරණය හේතුවෙන් කිලිනොච්චිය දිස්ත්‍රික්කයේ පච්චිලප්පලෙ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අයත් කුරුන්චතිවු (අලිමංකඩ - උතුර) ලුණු ලේවායේ නිෂ්පාදන හා මෙහෙයුම් කටයුතු නවතා දමා තිබුණු අතර එම කටයුතු නැවත ආරම්භ කිරීම සඳහා 2017 දෙසැම්බර් 12 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබුණි. ඒ අනුව 2022 ජුලි 21 දින රජයේ තක්සේරු දෙපාර්තමේන්තුව විසින් මෙම ඉඩම රු.205,000,000 කට තක්සේරු කර දීර්ඝකාලීන බදු ගිවිසුමක් මගින් සමාගම වෙත පවරා ගැනීම සඳහා උතුරු පළාත් ආණ්ඩුකාරවරයා වෙතින් ඉල්ලීම් කර තිබුණද සමාලෝචිත වර්ෂය අවසාන වන විටත් පවරා දී නොතිබුණි. මේ හේතුවෙන් දේශීය ලුණු නිෂ්පාදනය ඉහළ නැංවීම තුළින් රටේ අවශ්‍යතාවය සඳහා ලුණු ආනයනය කිරීම අවම කිරීම සඳහා සුදුසු වපසරියක් මෙම ලේවායේ පැවතිය ද එය තවදුරටත් නිශ්කාර්යව තබා තිබුණි.

(ඈ) 2023/2024 වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරී සැලැස්ම ප්‍රධාන අරමුණු 08 කට අදාළව උප-ක්‍රියාකාරකම් 30 කින් සමන්විත වී තිබුණු අතර ඉන් ක්‍රියාකාරකම් 7 ක ප්‍රගතිය සියයට 0 වූ අතර ක්‍රියාකාරකම් 5ක ප්‍රගතිය සියයට 20 ත් 50 ත් අතර පරාසයක පැවතුණි.

ඩබ්ලිව්. පී. සී. වික්‍රමරත්න
විගණකාධිපති

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

මූල්‍ය ප්‍රකාශන

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු මස 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශය.

	සටහන්	2024		2023
		රු. ශත		රු. ශත
මුළු ආදායම	3	502,573,939		343,140,970
අඩු කිරීම				
අගය එකතු කිරීම මත බදු		-		-
ශුද්ධ ආදායම		**502,573,939**		**343,140,970**
විකුණුම් පිරිවැය	4	**(217,532,859)**		**(167,761,852)**
දළ ලාභය		**285,041,080**		**175,379,118**
අනෙකුත් මෙහෙයුම් ආදායම්	5	**15,735,544**		**15,579,808**
විකුනුම් සහ බෙදාහැරීමේ පිරිවැය	6	**(20,880,522)**		**(6,731,065)**
පරිපාලන වියදම්	7	**(50,568,685)**		**(35,180,835)**
මෙහෙයුම් ලාභය/ (පාඩුව)		**229,327,416**		**149,047,026**
මූල්‍ය ආදායම්	8	**58,764,770**		**43,960,568**
මූල්‍ය පිරිවැය		**(609,337)**		**(135,698)**
වර්ෂය සඳහා වන ආදායම් බදු ගෙවීමට පෙර ලාභය		**287,482,849**		**192,871,896**
ආදායම් බදු වියදම්	9	**(89,253,353)**		**(58,065,641)**
වර්ෂය සඳහා වන ආදායම් බදු ගෙවූ පසු ලාභය		**198,229,496**		**134,806,255**
අනෙකුත් විස්තීර්ණ ආදායම / වියදම්, ශුද්ධ බදු				
ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙන් පසුව නැවත වර්ගීකරණය කරනු නොලබන අයිතම				
රැකියා පසු ප්‍රතිලාභ වගකීම මත ආයුගණක ලාභය / අලාභය		**411,199**		**(448,686)**
අව ප්‍රමාණය කරන ලද ලාභ / (පාඩු) මත බලපාන විලම්බිත බදු				**(720,000)**
ලාභ හෝ අලාභ ප්‍රකාශනයෙන් පසුව නැවත වර්ගීකරණය කරනු ලබන අයිතම				
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම / වියදම්, ශුද්ධ බදු		198,640,695		133,637,569
වර්ෂය සඳහා මුළු විස්තීර්ණ ආදායම, ශුද්ධ බදු				
කොටසක් සඳහා මූලික ඉපයීම	10	662		470

(පිටුව 01)

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය තත්වය පිළිබඳ ප්‍රකාශය

සටහන්		2024 රු.		2023 රු.
ජංගම නොවන වත්කම්				
දේපළයන්ත්‍ර සහ උපකරණ ,	11	318,550,188		141,149,360
		318,550,188		141,149,360
ජංගම වත්කම්				
පරිලේඛණ (ඉන්වෙන්ට්‍රි)	12	87,682,455		59,421,160
මූල්‍යමය වත්කම්	13	333,491,229		272,561,908
වෙළඳාම් සහ අනෙකුත් ලැබීම්	14	64,876,202		33,225,220
මුදල් සහ මුදලට සමාන දේ	15	18,407,076		77,345,538
		504,456,962		442,553,826
මුළු වත්කම්		823,007,150		583,703,186
කොටස් සහ වගකීම්				
ප්‍රාග්ධනය සහ සංචිත				
ප්‍රකාශිත ප්‍රාග්ධනය	16	30,000,000		30,000,000
ප්‍රත්‍යාගණිත සංචිත		6,589,500		1,680,000
ආදායම් සංචිත	17	524,895,069		426,713,139
සමස්ථ කොටස්		561,484,569		458,393,139
ජංගම නොවන වගකීම්				
රජයේ ප්‍රතිපාදන	18	120,457,434		35,282,026
විලම්භිත බදු බැරකම් / (වත්කම්)	19	18,654,395		16,124,684
විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්	20	11,456,371		10,546,833
		150,568,200		61,953,543
ජංගම වගකීම්				
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්	21	36,910,349		26,998,301
ගෙවිය යුතු / (නැවත අයකර ගත හැකි) ආදායම් බදු	22	74,044,032		36,358,203
		110,954,380		63,356,504
සමස්ථ කොටස් සහ		**823,007,150**		**583,703,186**

මෙම මූල්‍ය ප්‍රකාශණ 2007 අංක 07 දරන සමාගම් පනතේ අවශ්‍යතාවයන්ට අනුකූල වේ.

-----------------------------   2024/08/29

මූල්‍ය කළමනාකරු   දිනය

මෙම මූල්‍ය ප්‍රකාශණ පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සම්බන්ධව අධ්‍යක්ෂ මණ්ඩලය වග කියනු ලැබේ. අධ්‍යක්ෂ මණ්ඩලය වෙනුවෙන්,

	නම	අත්සන
අධ්‍යක්ෂ 1	------------------------	
අධ්‍යක්ෂ 2		------------------------

අනුමත කර අත්සන් කරන ලදී.

අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අත්සන් කරන ලද දිනය 2024/08/29

(පිටුව 02)

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා සම කොටස් වෙනස් වීම පිළිබඳ ප්‍රකාශය.

	ප්‍රකාශිත ප්‍රාග්ධනය	ප්‍රත්‍යාගණිත සංචිත	ආදායම් සංචිත	එකතුව
	රු.	රු.	රු.	රු.
2021 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	2,400,000	174,269,603	206,669,603
වර්ෂය සඳහා ශුද්ධ ලාභය			60,170,921	60,170,921
ලාභාංශ ගෙවීම			(3,351,608)	(3,351,608)
2022 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	2,400,000	317,628,964	350,028,964
කලින් වර්ෂයේ බදු කුලිය ගැලපීම - මන්නාරම			(5,722,080)	(5,722,080)
වර්ෂය සඳහා ශුද්ධ ලාභය			134,806,255	134,806,255
ප්‍රත්‍යාගණිත ඉපයීම් මත බලපාන විලම්බිත බදු		(720,000)		(720,000)
ලාභාංශ ගෙවීම			(20,000,000)	(20,000,000)
2023 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	1,680,000	426,713,139	458,393,139
ප්‍රත්‍යාගණිත ඉපයීම්		4,909,500	-	4,909,500
වර්ෂය සඳහා ශුද්ධ ලාභය			198,229,496	198,229,496
ලාභාංශ ගෙවීම			(100,000,000)	(100,000,000)
2024 මාර්තු 31 වන දිනට ශේෂය	30,000,000	6,589,500	524,942,635	561,532,135

(පිටුව 03)

මාන්තායි සෝල්ට් ලිමිටඩ්

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා මූල්‍ය ප්‍රවාහය පිළිබඳ ප්‍රකාශය.

	2024		2023
	රු		රු
මෙහෙයුම් කටයුතුවලින් මූල්‍ය ප්‍රවාහය			
බදු ගෙවීමට පෙර මෙහෙයුම් ලාභය/(පාඩුව)	287,482,849		192,871,896
ගැලපීම්			
ක්ෂය සහ ක්‍රමක්ෂය	27,698,291		22,323,450
ක්‍රමක්ෂය	(14,824,592)		(14,824,592)
වත්කම් බැහැර කිරීම මත ලාභය			(230,350)
පාරිතෝෂිත ප්‍රතිපාදන	1,831,340		1,219,456
ආදායම් බදු ප්‍රතිපාදන			
කපා හරින ලද අය විය යුතු වැට් බදු ආදායම්			
ස්ථිර තැන්පතු පොලී ආදායම්	(58,216,559)		(42,841,697)
තැන්පතු පොලී ආදායම්	(411,606)		(19,252)
	(43,923,126)		(34,372,985)
කාරක ප්‍රාග්ධනය වෙනස්වීම්වලට පෙර වර්ෂය සඳහා මෙහෙයුම් ලාභය	**243,559,722**		**158,498,911**
කාරක ප්‍රාග්ධනයේ වෙනස් වීම්			
ඉන්වෙන්ට්‍රි හී වැඩිවීම්/(අඩුවීම්)	(28,261,295)		(37,757,555)
වෙළඳ සහ අනෙකුත් ලැබීම් හී (වැඩිවීම)/ අඩුවීම්	(31,650,982)		(231,436)
වෙළඳ සහ අනෙකුත් ගෙවීම් හී (වැඩිවීම)/ අඩුවීම්	9,912,048		10,744,795
	(50,000,228)		(27,244,196)
මෙහෙයුම් තුලින් ජනනය වූ මුදල්	193,559,494		131,254,715
පාරිතෝෂිත ගෙවීම්	(921,803)		(315,638)
ආදායම් බදු/රඳවාගත් බදු ගෙවීම්	(49,241,040)		(19,330,000)
	(50,162,843)		(19,645,638)
මෙහෙයුම් කටයුතු තුලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය	143,396,651		111,609,077
ආයෝජන කටයුතුවල මූල්‍ය ප්‍රවාහය			
දේපළ, යන්ත්‍ර සහ උපකරණ	(25,948,088)		(20,724,021)
ස්ථිර වත්කම් බැහැර කිරීම්			230,350
කාරක වර්ධනය	(174,076,691)		(10,386,613)
ආයෝජන ඉවත්කර ගැනීම්			214,759,032
ස්ථාවර තැන්පතුවල ආයෝජනය	(60,938,500)		(260,000,000)
ස්ථිර තැන්පතු පොලී ආදායම්	58,216,559		5,881,528
තැන්පතු සහ පොලී ආදායම්	411,606		

මන්නාරම කල්බදු කුලී			(5,722,080)
ආයෝජන කටයුතුවලින් ගලා ගිය ශුද්ධ මූල්‍ය ප්‍රවාය	(202,335,113)		(75,961,804)
මූල්‍ය කටයුතුවල මූල්‍ය ප්‍රවාහය			
ලාභාංශ ගෙවීම්	(100,000,000)		(20,000,000)
රජයේ ප්‍රතිපාදන ලැබීම්	100,000,000		
මූල්‍ය කටයුතුවලින් ගලා ආ ශුද්ධ මූල්‍ය ප්‍රවාහය			(20,000,000)
වර්ෂය තුළ මුදල් සහ මුදල්වලට සමාන දෑවල ශුද්ධ වර්ධනය			
වර්ෂය ආරම්භයේ දී මුදල් හා මුදල් වලට සමාන දෑ	(58,938,462)		15,670,510
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ	77,345,538		61,675,028
	18,407,076		77,345,538
වර්ෂය අවසානයේ දී මුදල් හා මුදල්වලට සමාන දෑ විශ්ලේෂණය කිරීම			
බැංකුවේ ඇති මුදල්	18,407,076		77,345,538

(පිටුව 04)

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන සඳහා සටහන්.

1. සංස්ථාපිත තොරතුරු

1.1 වාර්තාකරණ අස්තිත්වය

ජාතික ලුණු සමාගම යනු ශ්‍රී ලංකාවේ කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශය (පූර්ණ වශයෙන් ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයට අයත්) යටතේ ශ්‍රී ලංකාව තුළ ස්ථාපිත සීමිත වගකීම් සහිත රාජ්‍ය ව්‍යාපාර සමාගමකි. සමාගමේ ලියාපදිංචි කාර්යාලය කොළඹ 05, ඇල්විටිගල මාවතේ 561/3 දරන ස්ථානයේ පිහිටා ඇති අතර, ප්‍රධාන ව්‍යාපාරික ස්ථානය ග්‍රෑන්ඩ් බසාර්, මන්නාරම සහ අලිමංකඩ යන ස්ථානයන් හී පිහිටා ඇත.

1.2 ප්‍රධාන ක්‍රියාකාරකම් සහ මෙහෙයුම්වල ස්වභාවය

වර්ෂය තුළ සමාගමේ ප්‍රධාන ක්‍රියාකාරකම වූයේ ශ්‍රී ලංකාවේ ලුණු නිෂ්පාදනයේ දීර්ඝ ඉතිහාසය ඉදිරියට ගෙන යාමයි. එම සමාගම සාමාණ්‍ය ලුණු නිෂ්පාදනය කරන අතර ඒවා අයඩින් සහිත ලුණු, කැට ලුණු, සහ කාර්මික ලුණු ආකාරයට ශ්‍රී ලංකාව තුළ බෙදා හරිනු ලැබේ.

1.3 අංක 05 සිට 42 දක්වා පිටුවල දක්වා ඇති මූල්‍ය ප්‍රකාශණය සඳහා සටහන් මෙම මූල්‍ය ප්‍රකාශනවල කොටසක් ලෙස අඛණ්ඩව පවතී.

1.4 වර්ෂය අවසාන වන විට සේවක සංඛ්‍යාව 57 කි. (2023 - 57)

1.5 මූල්‍ය ප්‍රකාශණයට බලය දුන් දිනය සහ අනුමත කළ දිනය

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා ජාතික ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන් 2024.08.29 වන දිනැති අධ්‍යක්ෂ මංඩලයේ යෝජනා සම්මතය අනුව නිකුත් කිරීමට බලය දෙන ලදී.

2. සකස්කිරීමේ පදනම සහ ගිණුම්කරණ ප්‍රතිපත්ති.

2.1 සමාන්‍ය ප්‍රතිපත්ති

2.1.1 අනුකූලතා ප්‍රකාශය

මෙම මූල්‍ය ප්‍රකාශය, ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට සහ 2007 අංක 07 දරන සමාගම් පනතේ නිර්ණායකයන්ට අනුකූලව ඓතිහාසික පිරිවැය පදනම මත පදනම්ව සකස් කර ඇත.

(පිටුව 05)

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය

සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා වන සටහන්

2.1.2 සකස්කිරීමේ පදනම

මෙම මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරි ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුව සකස් කර ඇත. මෙම මූල්‍ය ප්‍රකාශණ ශ්‍රී ලංකා රුපියල් (රු.) වලින් ඉදිරිපත් කරන අතර, ශ්‍රී ලංකා රුපියල් වලින් ඉදිරිපත් කරනු ලබන සියළු මූල්‍ය තොරතුරු ආසන්න රුපියලට වටයා ඇත.
සමාගමේ මූල්‍ය ප්‍රකාශයන් ඓතිහාසික පිරිවැය සම්මුතිය මත සකස් කර ඇත.

වර්තමාන නිරුපනය සමඟ සනාත කිරීම සඳහා, අවශ්‍ය ව්‍යවස්ථාවන් හී වර්තමාන වර්ෂය සඳහා වන ඉදිරිපත් කිරීම් සමඟ ගැලපෙන පරිදි සංසන්දනාත්මක තොරතුරු අවශ්‍ය පරදි නැවත වර්ගීකරණ කර නොමති නම් සහ වෙනත් ආකාරයකින් ප්‍රකාශකර නොමැති නම් සමාගම විසින් භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්ති පෙර වර්ෂයේ ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අනුරූප වේ.

2.1.3 අඛණ්ඩභාවය

අධ්‍යක්‍ෂවරුන් විසින්, සමාගම අඛණ්ඩව ඉදිරියට පවත්වාගෙන යාමේ හැකියාව පිළිබඳව තක්සේරුවක් කර ඇති අතර, ඔවුන් එය ඇවර කිරීමට හෝ වෙළඳාම නතර කිරීමට අදහස් නොකරයි.

2.1.4 ඇස්තමේන්තු සහ තීන්දු භාවිතා කිරීම

ගිණුම්කරණ ප්‍රතිපත්ති යෙදවුම් සහ වාර්තා කරන ලද වත්කම්, වගකීම්, ආදායම් සහ වියදම් ප්‍රමාණයට බලපාන විනිශ්චයන්, ඇස්තමේන්තු සහ උපකල්පනයන් සිදු කිරීම සඳහා ශ්‍රී ලංකාවේ වරලත් ගණකාධිකාරීවරුන්ගේ ආයතනය විසින් නිකුත් කරන ලද කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්ට අනුකූලව මූල්‍ය ප්‍රකාශන සකස් කිරීම කළමනාකාරීත්වයට අවශ්‍ය වේ. තථ්‍ය ප්‍රතිඵල ඇස්තමේන්තුගත ප්‍රතිඵලවලින් වෙනස් විය හැකිය.

ඇස්තමේන්තු සහ පාදක වූ උපකල්පන පදනම් වී ඇත්තේ ඓතිහාසික අත්දැකීම් සහ ඒ ඒ තත්වයන් යටතේ සාධාරණ යැයි විශ්වාස කෙරෙන අනාගත සිදුවීම් පිළිබඳ අපේක්ෂාවන් ඇතුළු විවිධ සාධක මත ය.

ඇස්තමේන්තු සහ මූලික වූ උපකල්පනයන්, කටයුතු අඛණ්ඩව සිදුකරගෙන යන්නේ යැයි යන පදනම මත සමාලෝචනය කරනු ලැබේ. ඇස්තමේන්තු සංශෝධනය කරන ලද කාල පරිච්ඡේදය තුළ සහ බලපෑමට ලක්වන ඕනෑම අනාගත කාල පරිච්ඡේදයන් තුළ ගිණුම්කරණ ඇස්තමේන්තු සඳහා වන සංශෝධන හඳුනා ගැනේ.

2.1.5 වැදගත්කම් සහ සමූහණය

සමාන අයිතමවලින් යුතු සෑම ප්‍රමාණාත්මක පන්තියක්ම මූල්‍ය ප්‍රකාශනවල වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ. ස්වභාවයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් අසමාන අයිතම ඒවා වැදගත් වන්නේ නම් මිස වෙන වෙනම ඉදිරිපත් කරනු ලැබේ.

2.1.6 වාර්තාකරන කාල පරිච්ඡේදයෙන් පසුව සිදුවී ඇති වැදගත් සිදුවීම්.

වර්තාගත කරන ලද දිනට පසුව සිදු වී ඇති සිදුවීම් වල වැදගත්කම සළකා බලා ඇති අතර, අවශ්‍ය අවස්ථාවල දී මූල්‍ය ප්‍රකාශනවල සුදුසු ගැලපීම් සහ අනාවරණය කිරීම් සිදු කර ඇත.

(පිටුව 06)

2.1.7 බදුකරණය

2.1.7. (අ) ප්‍රවර්තන බදු

බදු අය කිරීම සඳහා වන ශාස්තුව පදනම් වන්නේ, 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූලව බදු අය නොකරණ භාණ්ඩ සඳහා ගැලපීම් කරන ලද වාර්ෂික ආදායම මත ය.

2.1.7. (ආ) විලම්බිත බදුකරණය

මූල්‍ය වාර්තාකරණ අරමුණු සඳහා භාවිතා කරණ ලද වත්කම් හා වගකීම් ප්‍රමාණයන් සහ බදුකරණ අරමුණු සඳහා භාවිතා කරන ලද ප්‍රමාණයන් අතර තාවකාලික වෙනස්කම් සම්බන්ධයෙන් විලම්බිත බදු හඳුනාගනු ලැබේ. විලම්බිත බදු ගණනය, වාර්තා කිරීමේ කාලපරිච්ඡේදය අවසානයේදී සමාගම අපේක්ෂා කරන ආකාරයට සමාගමේ වත්කම් සහ වගකීම ප්‍රමාණයන් පියවා ගැනීමට හෝ අයකරගැනීමට අනුගමනය කළ හැකි බදු ප්‍රතිඵලය පිළිබිඹු කරයි.

ප්‍රවර්තන බදු වත්කම් සහ වගකීම් හිලව් කිරීමට නීත්‍යානුකූලව බලාත්මක අයිතියක් තිබේ නම් විල්ම්බිත වත්කම් සහ බැරකම් හිලව් කෙරෙන අතර, එකම බදු අධිකාරිය විසින් බදු අයකළ හැකි එකම බදු ඒකකය මත බදු ගෙවීමට අදාල කිරීම හෝ විවිධ බදු ආයතන ශුද්ධ පදනමක් මත ප්‍රවර්තන බදු වගකීම් හා වත්කම් නිරවුල් කිරීමට ඔවුන් අදහස් කරයි නම් ඔවුන්ගේ බදු වත්කම් සහ වගකීම් එකවර අවබෝධ කරනු ලැබේ.

විලම්බිත බදු වත්ක්මක් ලෙස හඳුනාගනු ලබන්නේ, අනාගත තාවකාලික වෙනස්කම් සඳහා භාවිත කළ හැකි, භාවිතා නොකරන ලද බදු හානි සහ මට්ටමක් දක්වා අඩුකළ හැකි තාවකාලික වෙනස්කම් සඳහා භාවිත කළ හැකි අනාගතයේ බදු අයකළ හැකි ලාභයයි. වාර්තාකරණ සෑම දිනයකදීම විලම්බිත බදු වත්කම් සමාලෝචනය කරනු ලබන අතර අදාළ ප්‍රතිලාභ සාක්ෂාත් කර ගැනීම තවදුරටත් සිදුවිය නොහැකි තරමට අඩු කරනු ලැබේ.

විලම්බිත බදු වත්කම් සහ වගකීම් මනිනු ලබන්නේ වාර්තාකරණ දිනය මගින් බලාත්මක කරන ලද හෝ සැලකිය යුතු ලෙස නීතිගත කර ඇති නීති මත පදනම්ව, ආපසු හැරවීමේදී තාවකාලික වෙනස්කම් වලට අදාළ වනු ඇතැයි අපේක්ෂා කරන බදු අනුපාතයන් මත ය.

(පිටුව 07)

2.1.8 ණය ගැණුම් පිරිවැය

ණය ලබා ගැනීමේ පිරිවැය, කාල සීමාව තුළ දී ඔවුන් විසින් දරන ලද වියදමක් ලෙස හඳුනා ගැනේ.

2.2 වත්කම් තක්සේරු කිරීම සහ ඒවා ගණනය කිරීමේ පදනම.

මූල්‍ය තත්ව ප්‍රකාශණයේ ජංගම වත්කම් ලෙස වර්ග කර ඇති වත්කම් වන්නේ සමාගමේ සාමාන්‍ය ව්‍යාපාර මෙහෙයුම් චක්‍රය තුළ හෝ වාර්තා කරනු ලබන දිනයේ සිට වසරක කාලයක් තුළ අති මුදල් සහ මුදල් බවට පරිවර්තනය කිරීමට බලාපොරොත්තු වන වත්කම් වේ.

ජංගම නොවන වත්කම් යනු වාර්තා කරනු ලබන දිනයේ සිට වසරක කාලයක් ඔබ්බට සමාගම විසින් රඳවා තබා ගැනීමට අපේක්ෂිත වත්කම් වේ.

2.2.1 මුදල් හා මුදලට සමාන දේ

මුදල් හා මුදලට සමාන දේ යන්න, අතේ ඇති මුදල්, ඉල්ලුම් තැන්පතු සහ කෙටිකාලීන ඉහළ ද්‍රවශීලතාවයක් ඇති මුදල් වලට පහසුවෙන් පරිවර්තනය කළ හැකි සහ වටිනාකමෙහි වෙනස් වීමේ සුළු අවදානමට යටත් ආයෝජන ලෙස විස්තර කෙරේ. මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ අරමුණු සඳහා, මුදල් සහ මුදල් හා සමාන දේවල් යන්න, අතේ ඇති මුදල් සහ බැංකු තැන්පතු ඉල්ලුමට අනුව ආපසු ගෙවිය යුතු බැංකු අයිරා වලින් සමන්විත වේ.

මුදල් ප්‍රවාහ ප්‍රකාශය

මුදල් ප්‍රවාහ ප්‍රකාශය "වක්‍ර ක්‍රමය" භාවිතා කරමින් පිළියෙළ කර ඇත. මුදල් ප්‍රවාහ ප්‍රකාශය ඉදිරිපත් කිරීමේ අරමුණු සඳහා, ගෙවූ පොලී, ලද පොලී සහ ලැබුණු ලාභාංශ මෙහෙයුම් මුදල් ප්‍රවාහය ලෙස වර්ග කර ඇති අතර, ගෙවන ලද ලාභාංශ මූල්‍ය මුදල් ප්‍රවාහය ලෙස වර්ග කර ඇත.

2.2.2 දේපළ, යන්ත්‍ර සහ උපකරණ

දෙපළ, යන්ත්‍ර සහ උපකරණ අයිතමයන් මනිනු ලබන්නේ සමුච්චිත ක්ෂයවීම් සහ සමුච්චිත හානි පාඩු අඩු කිරීමෙනි.

පිරිවැය යන්නට, වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළහැකි වියදම් ඇතුළත් වේ. ස්වයංව සාදන ලද වත්කම්වල (self-constructed) පිරිවැයට පහත සඳහන් දේ ඇතුළත් වේ:

(පිටුව 8)

ජාතික ලුණු සමාගම
2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය
සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

දේපළ, යන්ත්‍ර සහ උපකරණ (ඉතිරිය.)

- අමුද්‍රව්‍ය පිරිවැය සහ සෘජු ශ්‍රම පිරිවැය
- වත්කම්ක්, ඒවායේ අපේක්ෂිත භාවිතය සඳහා ක්‍රියාකාරී තත්වයට ගෙන ඒම සඳහා සෘජුව දරන ලද වෙනත් ඕනෑමවියදමක් ;
- වත්කම් ඉවත් කිරීමට හෝ නැවත වැඩ බිමේ ස්ථාපිත කිරීමට සමාගම බැඳී ඇති විට, භාණ්ඩවල කොටස් ඉවත් කිරීම, එවා පිහිටි ස්ථානයෙන් ඉවත් කිරීම සහ නැවත ස්ථාපිත කිරීම සඳහා ඇස්තමේන්තු කළ පිරිවැය;

අදාළ උපකරණවල ක්‍රියාකාරීත්වයට අත්‍යවශ්‍ය වන මිලදී ගත් මෘදුකාංග එම උපකරණයේ කොටසක් ලෙස ප්‍රාග්ධනීකරණය කර ඇත. දේපල, යන්ත්‍ර සහ උපකරණ අයිතමයේ කොටසක විවිධ ප්‍රයෝජනවත් භාවිතාවන් ඇති විට, ඒවා දේපල, යන්ත්‍ර සහ උපකරණවල වෙනම අයිතම (ප්‍රධාන සංරචකයේ) ලෙස ගණන් ගැනේ.

බැහැර කිරීම් මත කිසියම් ලාභයක් හෝ අලාභයක් (අයිතමයේ අපහරණයෙන් ශුද්ධ නිකුතුව සහ අයිතමයේ ප්‍රවාහන පිරිවැය අතර වෙනස ලෙස ගණනය කරනු ලැබේ) ආදායම් ප්‍රකාශයේ වෙනත් මෙහෙයුම් ආදායමක් ලෙස හඳුනාගනු ලැබේ. නැවත තක්සේරු කරන ලද වත්කම් විකුණන විට, නැවත ඇගයීමේ අතිරික්ත සංචිතවලට ඇතුළත් ඕනෑම මුදලක් රඳවාගත් ඉපැයීම් වෙත මාරු කරනු ලැබේ.

පසු පිරිවැය

යම් දේපලකට හෝ උපකරණවලට අයත් අයිතමයේ සංඝටකයක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය, එම කොටස තුළ අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගමට ගලා ඒමට ඉඩ තිබේ නම් සහ එහි පිරිවැය විශ්වසනීයව මැනිය හැකි නම් එකී අයිතමයේ ප්‍රවාහන පිරිවැය ලෙස හඳුනා ගනු ලැබේ. ප්‍රතිස්ථාපනය කරන ලද කොටසෙහි ප්‍රවාහන පිරිවැය හඳුනාගෙන නොමැති. දේපල හා උපකරණවල එදිනෙදා සේවා සඳහා වන පිරිවැය, ආදායම් ප්‍රකාශයේ දී දරන ලද වියදමක් ලෙස හඳුනාගෙන ඇත.

අලුත්වැඩියාව සහ නඩත්තුව

අළුත්වැඩියා කිරීම් සහ නඩත්තු කිරීම්, සිදු කරනු ලබන මූල්‍ය කාල පරිච්ඡේදය තුළ විස්තීර්ණ ආදායම් ප්‍රකාශයේ දක්වනු ලැබේ. පවත්නා වත්කම්වල කාර්යක්ෂමතාව පිළිබඳව මෑතකදී කළ තක්සේරු ප්‍රමිතියට අතිරික්තව අනාගත ආර්ථික ප්‍රතිලාභ සමාගාමට ගලා ආ විට සහ වත්කමමේ හඳුනාගත හැකි කොටසක් අළුත්වැඩියා කරන විට ප්‍රධාන අළුත්වැඩියා කිරීම් වල පිරිවැය ධාරණ පිරිවැයට ඇතුළත් කරයි. අදාල වත්කම්වල ඉතිරි ඵලදායී ආයු කාලය තුළ ප්‍රධාන නවීකරණයන් ක්ෂය කෙරේ.

(පිටුව 09)

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය

සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්.

ක්ෂය

වත්කම් හා අන්තර්ගත අනාගත ආර්ථික ප්‍රතිලාභ, අපේක්ෂිත පරිභෝජන රටාව මඟින් වඩාත් සමීපව පිදහා දක්වන බැවින් දේපල හා උපකරණ අයිතමයක එක් එක් කොටසෙහි ඇස්තමේන්තුගත ප්‍රයෝජයට ගන්නා කාලය මත (සක්‍රීය ආයු කාලය) ඍජු රේඛීය පදනමක් මත විස්තීර්ණ ආදායම් ප්‍රකාශය තුළ ක්ෂයවීම් හඳුනා ගනු ලැබේ. ඉඩම් ක්ෂය නොවේ. වර්තමාන හා සංසන්දනාත්මක කාල පරිච්ඡේදයන් සඳහා ඇස්තමේන්තුගත සක්‍රිය ආයු කාලය පහත පරිදි වේ.

වත්කම් පංතිය	පදනම
සියළුම ගොඩනැගිලි	වසර 20 ට වැඩි 5% බැගින්
යන්ත්‍රෝපකරණ වතුර පොම්ප	වසර 05 ට වැඩි 20% බැගින්
කාර්යාල උපකරණ	වසර 05 ට වැඩි 20% බැගින්
සියළුම ගෘහ භාණ්ඩ	වසර 10 ට වැඩි 10% බැගින්
සියළුම මෝටර් රථ	
පරිගණක උපාංග	වසර 10 ට වැඩි 10% බැගින්
ට්‍රැක්ටර්	
යටිතල පහසුකම් සංවර්ධනය	වසර 05 ට වැඩි 20% බැගින්

ක්ෂය කිරීමේ ක්‍රමය, සක්‍රිය ආයු කාලය සහ අවශේෂ වටිනාකම්, එක් එක් වාර්තා කිරීමේ දිනයන් හිදී නැවත තක්සේරු කර සහ උචිත පරිදි සකස් කර ඇත.

ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රාග්ධන වැඩ සටහන්

ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රාග්ධන වැඩසටහන් වල ප්‍රගතිය පිරිවැය අනුව ප්‍රකාශ කෙරේ. මේවා දේපළ, යන්ත්‍ර සහ උපකරණ මෙන්ම ප්‍රාග්ධනායනය සඳහා ඇති පද්ධති සංවර්ධනය කිරීම සඳහා ඍජුව දරන ලද ප්‍රාග්ධන ස්වරූපයේ වියදම් වේ. අපගේ සංවිධානය තුළ ක්‍රියාත්මක කරමින් පවතින ප්‍රාග්ධන වැඩසටහන් 2024 මාර්තු මස 31 වන දිනට ප්‍රාග්ධනීකරණය කර ඇත. එබැවින් 2023/2024 වර්ෂය තුළ අදාළ දේපල ක්ෂයවීම් සිදු කර නොමැත.

2.2.3 කල්බදු

මූල්‍ය කල්බදු

කල්බදු අයිතමයේ හිමිකාරිත්වයට අමතරව සමස්ථ අවදානම සහ ප්‍රතිලාභ ඵලදායී ලෙස සමාගමට මාරු කරන මූල්‍ය කල්බදු මත වන දේපළ, යන්ත්‍ර සහ උපකරණ, ඒවායේ මිළ සහ දේපළ, යන්ත්‍ර සහ උපකරණ ලෙස ප්‍රකටව ඇති ද්‍රව්‍යයන්ට අනුව සහ මෙම වත්කම් භාවිතයෙන් සමාගම ලබා ගැනීමට අපේක්ෂිත ප්‍රයෝජන ලබා ගන්නා කාල පරිච්ඡේදය තුල ක්ෂය අනුව ප්‍රාග්ධනායනය කර ඇත.

බදු හිමිකරුට ගෙවිය යුතු අනුරූපී මූලික මුදල වගකීමක් ලෙස දක්වන අතර, වගකීම්වල ඉතිරි ශේෂය නිශ්චිත පොලී අනුපාතයක් ලෙස ලබා ගැනීම සඳහා කල්බදු ගෙවීම් මූල්‍ය ගාස්තු හා කල්බදු වගකීම් අඩු කිරීම අතර බෙදනු ලැබේ. කල්බදු කාලසීමාව තුළ ගෙවිය යුතු පොලිය අවිනිශ්චිත ගිණුමේ පොලියට මාරු කරනු ලැබේ. එක් එක් මූල්‍ය වර්ෂය සඳහා අදාල වන කුලී බැරකම් හී පොලිය බදු කාලයට අදාලවන ආදායම් ප්‍රකාශයට ඇතුලත් වේ.

(පිටුව 10)

2.2.4 ආයෝජන සහ අනෙකුත් මූල්‍ය වත්කම්

වර්ගීකරණය

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන්හි (ශ්‍රී ලංකා මූල්‍ය වාර්තාකරණ ප්‍රමිතීන් 9) විෂය පථය තුළ ඇති මූල්‍ය වත්කම්, පහත දැක්වෙන මිණුම් දඩුවලට අනුව වර්ග කරනු ලැබේ.

කාණ්ඩ:

සාධාරණ අගය මත පසුව මැනිය යුතු ඒවා (වෙනත් විස්තීරණ ආදායමක් මඟින් හෝ ලාභ හෝ අලාභ මඟින්}, සහ ක්‍රමක්ෂය මිලකට මැනිය යුතු ඒවා ලෙස වර්ග කෙරේ.

වර්ගීකරණය, මූල්‍ය වත්කම් කළමනාකරණය කිරීම සඳහා වන ආයතනයේ ව්‍යාපාර ආකෘතිය සහ මූල්‍ය ප්‍රවාහයේ ගිවිසුම් නියමයන් මත රඳා පවතී.

සාධාරණ අගය මත මනිනු ලබන වත්කම් සඳහා, ලාභ සහ පාඩු, ලාභ හෝ අලාභ එසේ නැතහොත් වෙනත් විස්තීරණ ආදායමක් ලෙස වාර්තා කරනු ලබයි. වෙළඳාම සඳහා රඳවා තබා නොගත් කොටස් ආයෝජනයන් සම්බන්ධයෙන් වන විට මෙය, වෙනත් විස්තීරණ ආදායමක් මඟින් සාධාරණ අගයක් ඇති කොටස් , ආයෝජනය සඳහා ගිණුම්කරණය සඳහා ආරම්භක පිළිගැනීමේ අවස්ථාවේ දී සමාගමට වෙනස් කළ නොහැකි වරණයක් තිබුනේ ද යන්න මත රඳා පවතී.

සමාගම ණය ආයෝජන නැවත වර්ගීකරණය කරන්නේ එම වත්කම් කළමනාකරණය සඳහා එහි ව්‍යාපාර ආකෘතිය වෙනස් වූ විට පමණි.

අ) පිළිගැනීම සහ පිළිනොගැනීම

මූල්‍ය වත්කම් නියම ආකාරයෙන් මිලදී ගැනීම් සහ විකුණුම් පිළිගනු ලබන්නේ සමාගම විසින් වත්කම් මිලදී ගැනීම හෝ විකිණීම සිදු කරනු ලබන වෙළඳ දිනයේ දී ය. මූල්‍ය වත්කම්වලින් මුදල් ලබා ගැනීමේ අයිතිය කල් ඉකුත් වී ඇති විට හෝ මාරු කර ඇති විට සහ සමාගම හිමිකාරිත්වයේ සියලු අවදානම් සහ ප්‍රතිලාභ සැලකිය යුතු ලෙස මාරු කර ඇති විට මූල්‍ය වත්කම් පිළිගනු නොලැබේ.

ආ) ඇගයීම

මූලික හඳුනාගැනීමේදී, සමාගම මූල්‍ය වත්කමක් එහි සාධාරණ අගයට අමතරව, ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් නොමැති මූල්‍ය වත්කම් සම්බන්ධයෙන්, මූල්‍ය වත්කම් අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි ගනුදෙනු පිරිවැය මත මැන බලයි. ලාභය හෝ අලාභය හරහා සාධාරණ අගයකින් ගෙන යන මූල්‍ය වත්කම්වල ගනුදෙනු පිරිවැය ලාභ හෝ අලාභ වශයෙන් වැය වේ.

කාවැද්දූ ව්‍යුත්පන්නයන් සහිත මූල්‍ය වත්කම්, ඒවායේ මුදල් ප්‍රවාහයන් මූලික හා පොලී පමණක් ගෙවන්නේද යන්න තීරණය කිරීමේදී ඒවා සම්පූර්ණයෙන්ම සලකා බලනු ලැබේ.

(පිටුව 11)

C) ණය උපකරණ

ණය උපකරණ පසුකාලීනව මැනීම, වත්කම් කළමනාකරණය සඳහා වන සමාගමේ ව්‍යාපාර ආකෘතිය සහ වත්කම්වල මූල්‍ය ප්‍රවාහ ලක්ෂණ මත රඳා පවතී. සමාගම සිය ණය උපකරණ වර්ගීකරණය කරන මිනුම් කාණ්ඩ තුනක් ඇත:

ක්‍රමක්ෂය පිරිවැය

ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහය මූලික ගෙවීම් සහ පොලී පමණක් නියෝජනය කරන අවස්ථාවේ දී එකී ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහය එකතු කිරීම සඳහා තබා ඇති වත්කම්, ක්‍රමක්ෂය පිරිවැයෙන් මනිනු ලැබේ. මෙම මූල්‍ය වත්කම්වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කෙරේ. හඳුනා නොගැනීම මත ඇතිවන ඕනෑම ලාභයක් හෝ අලාභයක්, ලාභ හෝ අලාභ වශයෙන් සෘජුවම හඳුනාගෙන විදේශ විනිමය ලාභ හා අලාභ සමඟ වෙනත් ලාභ/(අලාභ) තුළ විදහා දක්වයි. අඩු කළ පාඩු, ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කෙරේ.

වෙනත් විස්තීරණ ආදායමක් මඟින් සාධාරණ අගය

ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහය මූලික ගෙවීම් සහ පොලී පමණක් නියෝජනය කරන අවස්ථාවේ දී එකී ගිවිසුම්ගත මූල්‍ය ප්‍රවාහය එකතු කිරීම සඳහා සහ විකිණීම සඳහා තබා ඇති වත්කම්, වෙනත් විස්තීරණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමකින් මනිනු ලැබේ.ලාභ හෝ අලාභ වශයෙන් හඳුනාගත් ලාභ හෝ අලාභ, පොලී ආදායම සහ විදේශ විනිමය ලාභ සහ අලාභ අඩු කිරීම් හඳුනා ගැනීම සඳහා හැර, ධාරණ අගයෙහි වෙනස් වීම වෙනත් විස්තීර්ණ ආදායම් මඟින් ගනු ලැබේ. මූල්‍ය වත්කම් හඳුනා නොගත් විට, වෙනත් විස්තීර්ණ ආදායමකින් කලින් හඳුනාගෙන ඇති සමුච්චිත ලාභය හෝ අලාභය කොටස් වලින් ලාභයට හෝ අලාභයට නැවත වර්ගීකරණය කරනු ලබන අතර, වෙනත් ලාභ/(පාඩු) තුළ හඳුනා ගැනේ. මෙම මූල්‍ය වත්කම්වලින් ලැබෙන පොලී ආදායම ඵලදායී පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් මූල්‍ය ආදායමට ඇතුළත් කරයි. විදේශ විනිමය, ලාභ සහ අලාභ වෙනත් ලාභ/(අලාභ) තුළ ඉදිරිපත් කර ඇති අතර, වියදම් අඩුකිරීම ලාභ හෝ අලාභ ප්‍රකාශයේ වෙනම අයිතමයක් ලෙස ඉදිරිපත් කෙරේ.

ලාභය හෝ අලාභය මඟින් සාධාරණ වටිනාකම: ක්‍රමක්ෂය පිරිවැය හෝ වෙනත් විස්තීර්ණ ආදායමක් හරහා සාධාරණ වටිනාකමක් සඳහා වන නිර්ණායක සපුරාලන්නේ නැති වත්කම්, ලාභ හෝ අලාභය තුළින් සාධාරණ වටිනාකම මත මනිනු ලැබේ. ලාභය හෝ අලාභය මඟින් සාධාරණ වටිනාකම මත පසුව මනිනු ලබන ණය ආයෝජනයක ලාභයක් හෝ අලාභයක්, ලාභ හෝ අලාභයෙන් ලෙස හඳුනාගෙන එය පැන නගින කාල සීමාව තුළ වෙනත් ලාභ/(අලාභ) තුළ ඉදිරිපත් කරයි.

(පිටුව 12)

D) අඩු කිරීම්

අනෙකුත් විස්තීරණ ආදායම මඟින් සාධාරණ වටිනාකම සහ ක්‍රමක්ෂය පිරිවැය මත ගෙන යන සමාගමේ ණය උපකරණ හා සම්බන්ධ අපේක්ෂිත ණය පාඩු ඉදිරි දැක්මක් මත සමාගම තක්සේරු කරයි. ක්‍රියාත්මක වන අඩු කිරීමේ ක්‍රමවේදය, ණය අවදානමෙහි සැලකිය යුතු වැඩි වීමක් සිදු වී තිබේද යන්න මත රඳා පවතී. මූලික මූල්‍ය උපකරණ සහ මූල්‍ය වත්කම්, වෙළඳාම සඳහා කල් පිරෙන තෙක් රඳවා තබා ඇති, මූල්‍ය වත්කම්, ණය සහ ලැබිය යුතු මුදල් සහ විකිණීමට ඇති මූල්‍ය වත්කම් ලෙස වර්ගීකරණය කර ඇත. සමාගම මූලික හඳුනාගැනීමේදී එහි මූල්‍ය වත්කම් වර්ගීකරණය තීරණය කරනු ලැබේ.

ණය සහ ලැබීම්

ණය සහ ලැබිය යුතු මුදල් යන්නට, මුදල් සහ කෙටි කාලීන තැන්පතු, ස්ථාවර තැන්පතු සහ වෙළඳ සහ අනෙකුත් ලැබීම් ඇතුළත් වේ. ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමක් ඇති මූල්‍ය වත්කම් හැර, සියලුම මූල්‍ය උපකරණ ආරම්භයේ දී මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ වටිනාකම සහ ගනුදෙනු පිරිවැය මත ය. ණය සහ ලැබීම් යනු සක්‍රීය වෙළඳපොලක මිළ සඳහන් කර නොමැති ස්ථාවර හෝ තීරණය කළ හැකි ගෙවීම් සහිත ව්‍යුත්පන්න නොවන මූල්‍ය වත්කම් වේ. මූලික මිනුම් වලින් පසුව, එවැනි මූල්‍ය වත්කම් පසුව ක්‍රමක්ෂය මත මනිනු ලැබේ. අඩු කිරීම් නිසා ඇතිවන පාඩු විස්තීරණ ආදායම් ප්‍රකාශය තුළ හඳුනාගෙන ඇත.

මූල්‍ය වගකීම්

මූල්‍ය වගකීම්, කොන්ත්‍රාත් ගිවිසුමේ හරයට සහ මූල්‍ය වගකීම් නිර්වචනයට අනුකූලව ලාභ /පාඩු හෝ වෙනත් මූල්‍ය වගකීම් හරහා සාධාරණ වටිනාකමකින් යුත් මූල්‍ය වගකීම් ලෙස වර්ගීකරණය කර ඇත.

ලාභය හෝ අලාභය හරහා සාධාරණ වටිනාකමකින් වාර්තා වන මූල්‍ය වගකීම් හැර, සියලුම මූල්‍ය උපකරණ මුලින් මනිනු ලබන්නේ ඒවායේ සාධාරණ වටිනාකම සහ ගනුදෙනු පිරිවැය මත ය. පොලී සහිත ණය සහ ණය ගැනීම් සහ අනෙකුත් මූල්‍ය වගකීම් (වෙළඳාම සහ අනෙකුත් ගෙවීම්) ඇතුළු මූල්‍ය වගකීම් මුලින් මනිනු ලබන්නේ, අත්පත් කර ගැනීම සඳහා සෘජුවම ආරෝපණය කළ හැකි සාධාරණ වටිනාකමකින් යුත් අඩු ගනුදෙනු පිරිවැයකින් වන අතර පසුව සපල පොලී අනුපාත ක්‍රමය භාවිතා කරමින් ක්‍රමක්ෂ කළ පිරිවැය මත මනිනු ලැබේ. ක්‍රමක්ෂය පිරිවැය ගණනය කරනු ලබන්නේ, නිකුතුවේ කිසියම් වට්ටමක් හෝ අධිමිලක් සහ සඵළ පොලී අනුපාතිකයේ අනිවාර්ය අංගයක් වන පිරිවැය සැලකිල්ලට ගනිමිනි.

මූල්‍ය වගකීමක් වගකීම යටතේ ඇති බැඳීම ඉවත් කළ විට හෝ අවලංගු කළ විට හෝ කල් ඉකුත් වූ විට හඳුනා නොගනී. පවතින මූල්‍ය වගකීමක් එම පාර්ශ්වයේ වෙනත් අය විසින් සැලකිය යුතු ලෙස වෙනස් කොන්දේසි මත ප්‍රතිස්ථාපනය කරන විට හෝ පවතින වගකීමක නියමයන් සැලකිය යුතු ලෙස වෙනස් කරනු ලැබුවහොත්, එවැනි හුවමාරුවක් හෝ වෙනස් කිරීමක් මුල් වගකීම් හඳුනා නොගැනීමක් සහ නව වගකීමක් හඳුනා ගැනීමක් ලෙස සලකනු ලැබේ. මුල් මූල්‍ය වගකීමේ ධාරණ වටිනාකම සහ ගෙවන ලද සලකා බැලීම අතර වෙනස ආදායම් ප්‍රකාශයේ හඳුනාගෙන ඇත.

(පිටුව 13)

2.2.4 භාණ්ඩ වට්ටෝරු පොත්

ඉන්වෙන්ට්‍රි පිරිවැයට වඩා අඩු සහ ශුද්ධ උපලබ්දි වටිනාකම මත තක්සේරු කරනු ලැබේ. පළමුව ඇතුලත් කරන දෙය සහ පළමුව පිටකරන දෙය මත පිරිවැය මනිනු ලබන අතර, ප්‍රාග්ධන භණ්ඩ අත්පත්කර ගැනීම සඳහා සහ ඒවා වර්තමාන තත්වයට පත්කිරීමට සහ වර්තමානයේ පිහිටා ඇති ස්ථානයට ගෙන ඒම සඳහා දරන ලද සියළු වියදම් ඇතුලත් වේ. පිරිවැය යන්නට සියළුම ඍජු වියදම් සහ පොදු කාර්යයන් පිරිවැය ඇතුලත් වේ. ක්‍රියාත්මක වෙමින් පවතින වැඩ පිරිවැය මත ගණනය කරනු ලැබේ.

2.2.5 වගකීම් සහ ප්‍රතිපාදන

මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශණයේ ජංගම වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් වන්නේ ඉල්ලුම මත ගෙවිය යුතු හෝ වාර්තා කරන දින සිට වසරක් ඇතුලත ගෙවිය යුතු බැදීම් ය. ජංගම නොවන වගකීම් ලෙස වර්ග කර ඇති වගකීම් වන්නේ වාර්තා කරන දින සිට වසරක් ඉක්ම ගිය පසු අවසන් වන බැදීම් වේ.

මූල්‍ය ප්‍රකාශණ සකස් කිරීමේ දී හඳුනා ගන්නා ලද සියළුම වගකීම් ගිණුම් ගත කර ඇත. අතීත සිදුවීමක ප්‍රතිඵලයක් ලෙස, සමාගමට අර්ථකාරී හෝ නෛතික බැදීම් ඇති විට ප්‍රතිපාදන සහ වගකීම් හඳුනා ගැනෙන අතර, එය ආර්ථික ප්‍රතිලාභ පිටතට ගලා යාම සඳහා වගකීම් පියවීම අවශ්‍ය විය හැකියි.

2.2.5.1 විශ්‍රාම බැදීම් ප්‍රතිලාභ

(අ) විශ්‍රාම බැදීම් ප්‍රතිලාභ - පාරිතෝෂිකය

පාරිතෝෂිකය යනු අර්ථ දක්වන ලද ප්‍රතිලාභ සැළැස්මකි. මෙම වගකීම ඉටු කිරීම පිණිස, කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථිත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වල දැක්වෙන පරිදි සූත්‍ර සහ ක්‍රමවේද පදනම් කර ගනිමින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශණයේ ප්‍රතිපාදනයන් ඉදිරියට ගෙන යනු ලැබේ. එසේ වුව ද, 1983 අංක 12 දරන පාරිතෝෂික ගෙවීම් පනත යටතේ සේවකයකු සම්බන්ධයෙන් වගකීමක් පැන නගිනනේ සේවකයා විසින් වසර පහක අකණ්ඩ සේවා කාලයක් සම්පූර්ණ කිරීමෙන් පසුවයි.

(ආ) නිර්වචනය කරන ලද දායත්ව සැළැස්ම - සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තයන්ගේ භාර අරමුදල

නිර්වචනය කරන ලද දායක සැලැස්ම යනු, පශ්චාත් සේවා නියුක්ති ප්‍රතිලාභ සැලැස්මක් වන අතර, ඒ යටතේ ආයතනයක් වෙනම ආයතනයකට ස්ථාවර දායකත්වයක් ගෙවන අතර වැඩි මුදලක් ගෙවීමට නීතිමය හෝ සාධනීය බැදීමක් නොමැත. සියළුම සේවකයින් ආවරණය වන පරිදි සේවක අර්ථසාධක අරමුදල සහ සේවා නියුක්තිකයන්ගේ භාර අරමුදල් සඳහා දායකත්වය සඳහා වන බැදීම්, ලාභය හෝ අලාභය සඳහා වූ දරන ලද වියදමක් ලෙස හඳුනාගනු ලැබේ.

සේවකයින්ගේ දළ වැටුප් වලින් පිළිවෙලින් අර්ථසාධක අරමුදල සඳහා 12% ක් ද සේවා නියුක්තිකයින්ගේ භාර අරමුදල සඳහා 3% ක් ද ලෙස සමාගම දායකත්වය සපයනු ලැබේ.

(පිටුව 14)

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය

සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

2.3 විස්තීර්ණ ආදායම් ප්‍රකාශය

2.3.1 ආදායම් හඳුනාගැනීම

සමාගමට ආර්ථික ප්‍රතිලාභ ගලා එන තාක් දුරට ආදායම හඳුනා ගැනෙන අතර, ආදායම් සහ ඒ සඳහා දරන ලද හෝ දැරීමට සිදුවන පිරිවැය අනුව විශ්වසනීය ලෙස මැනිය හැකිය. වෙළඳ වට්ටම් සහ විකුණුම් බදු වලින් ලැබුණු හෝ ලැබිය යුතු ශුද්ධ වටිනාකම මත ආදායම මනිනු ලැබේ.ආදායම් හඳුනා ගැනීම සඳහා පහත දැක්වෙන විශේෂිත නිර්ණායක භාවිතා කරනු ලැබේ.

(අ) පාරිභෝගිකයා වෙත හිමිකම සහ අවධානම මාරු වී ඇති විට හෝ පාරිභෝගිකයා වෙත සේවය සපයා ඇති විට, ආදායම මූලික වශයෙන් උපචිත පදනම මත හඳුනා ගැනේ.

(ආ) අනෙකුත් ආදායම්

අනෙකුත් ආදායම් උපචිත පදනම මත හඳුනා ගැනේ.

(ඇ) රජයේ ප්‍රතිපාදන

කුඩා හා මධ්‍යම පරිමාණ අස්ථීත්වයන් සඳහා වන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතීන් වල 24.4 වන වගන්තියට අනුව, රජයේ ප්‍රතිපාදන ආදායමක් ලෙස හඳුනා ගැනේ.

2.3.2 වියදම් හඳුනා ගැනීම.

ආදායම් ප්‍රකාශයේ වියදම් හඳුනා ගැනීම, විශේෂිත ආදායම් අයිතමයක ඉපැයුම සහ දරන ලද පිරිවැය අතර ඍජු සම්බන්ධතාවය මත සිදු කරනු ලැබේ. ව්‍යාපාරය පවත්වාගෙන යාම සඳහා සහ දේපළ, යන්ත්‍ර සහ උපකරණ කාර්යක්ෂම තත්වයෙන් නඩත්තු කිරීම සඳහා දරන ලද සියළුම වියදම් වර්ෂය සඳහා ලාභය ගණනය කිරීමේ දී ආදායමට එකතු කර ඇත.

ලුණු ලේවායන් පුනරුත්තාපනය කිරීම සඳහා රජයෙන් ලැබුණු ප්‍රතිපාදන වියදම් යටතේ දක්වා ඇත.

2.4 වාර්තා කරන කාල පරිච්ඡේදය.

මූල්‍ය වාර්තාව, 2022 අප්‍රේල් 01 වන දින සිට 2023 මාර්තු 31 දින දක්වා වූ කාල පරිච්ඡේදය සඳහා සකස් කර ඇත.

2.5 අනාවරණය කිරීම්

2.5.1. මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

දීර්ඝ කාලයක පටන් අපගේ නිෂ්පාදන ක්‍රියාවලිය සම්බන්ධ විස්තර ජාතික ලුණු සමාගමේ මූල්‍ය ප්‍රකාශන දක්වා නොමැත. අලි මංකඩ සහ මන්නාරම ලුණු ලේවාන් හී යන්ත්‍රාගාරයන් හී ලාභය දක්වා නොමැති අතර, සිදු කෙරෙමින් පවතින වැඩ, අමුද්‍රව්‍ය, නිම නොකළ භාණ්ඩ සහ පිරිවැය කේන්ද්‍ර කර ගත් පොදු කාර්ය පිරිවැය ඉදිරිපත් කර නොමැත. ජාතික ලුණු සමාගමේ අපගේ ප්‍රධාන කාර්යය වන්නේ ලුණු නිෂ්පාදනය කිරීම සහ බෙදා හැරීමයි. එබැවින්, අපගේ මූල්‍ය ප්‍රකාශන කාර්යක්ෂමව ඉදිරිපත් කිරීමට ජාතික ලුණු සමාගම ගනු ලබන උත්සාහයන් අතරට නිෂ්පාදන ක්‍රියාවලියද ඇතුළත් වන අතර, තවද එහි ප්‍රතිඵලයක් වන්නේ ඉහළ කළමනාකාරීත්වයට තීරණය ගැනීමට තොරතුරු ලබා දීමයි.. අලි මංකඩ ලුණු ලේවායේ යන්ත්‍රාගාරය සහ මන්නාරම ලුණු ලේවායේ යන්ත්‍රාගාරය සඳහා වෙන වෙනම වෙළඳාම් සහ ලාභ අලාභ ගිණුම් සකස් කර ඇත. එය ඉහළ කළමනාකාරිත්වයට සහ රාජ්‍ය හිමිකරුවන්ට තීරණයක් ගැනීමට ප්‍රතිඵල ලබා දෙනු ඇත.

2.5.2. බදු ගෙවීම - බදු ගත් ඉඩම - මන්නාරම

මන්නාරම ඉඩම සඳහා බදු වශයෙන් රුපියල් 6.115,000.00 ක් ගෙවීමට අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කර ඇත. අදාළ ගෙවීම් මුදල මන්නාරම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2013-2023 දක්වා ගෙවා ඇත.

(පිටුව 15)

2.5.3. අලිමංකඩ ඉඩමේ බදු ගිවිසුම එහි ප්‍රවර්ථන ව්‍යාපාරය

රජයේ නිලධාරීන් සමඟ සමාලෝචනය සහ සාකච්ඡා කිරීම. අධ්‍යක්ෂ මණ්ඩලය ගිවිසුමක් ඇති කර ගැනීම සම්බන්ධයෙන් වගකීමක් දරන අතර එය සහතික කරනු ලබයි. මෙම වත්කම් ඇත්ත වශයෙන්ම කුඩා පරිමාණ කර්මාන්ත අමාත්‍යාංශය විසින් මිලදී ගෙන පසුව සීමාසහිත ජතික ලුණු සමාගම වෙත පවරා දෙන ලදී. වාර්තා කර නොමැති වත්කම් සුදුසු අගයන් අනුව තක්සේරු කර හඳුනාගැනීමට කටයුතු කරන අතර, ඒ සමබන්ධයෙන් යතා කාලයේ දී අවශ්‍ය පියවර පියවර ගනු ලැබේ.

2.5.4 සමාජ ආරක්ෂණ දායක බද්ද (SSCL)   - සියලු බදු ජාතික ලුණු සමාගම විසින් දරනු ලැබ ඇත අදාළ තීරණය 2022 දෙසැම්බර් 01 වන දින පැවති මිල තීරණ කමිටු රැස්වීම විසින් ගනු ලැබූ අතර 2022 දෙසැම්බර් 06 වන දින අධ්‍යක්ෂ මණ්ඩලයේ යෝජනාවකට අනුව නිකුත් කිරීමට බලය ලබා දී ඇත.

(පිටුව 16)

<u>ජාතික ලුණු සමාගම</u>

<u>මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්</u>

<u>2024 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා ආදායම්</u>

සටහන -03

විකුණුම්

	අලිමංකඩ	මන්නාරම	එකතුව
කිලෝග්‍රෑම් 01 පැකට්ටුව - සාමාන්‍ය ලුණු	375,000.00	-	375,000.00
සාමාන්‍ය ලුණු - කාර්මික	67,289,350.00	126,000.00	67,415,350.300
අයඩීන් මිශ්‍ර ලුණු	-	3,604,875.00	3,604,875.00
අයඩීන් මිශ්‍ර ලුණු - කිලෝග්‍රෑම් 01	62,500.00	119,500,450.00	119,562,950.00
මඩ ලුණු අලෙවිය	408,600.00	-	408,600.00
අයඩීන් මිශ්‍ර නොකළ ලුණු කැට	12,099,300.00	16,619,250.00	28,718,550.00
ලුණු අතුගෑම	-	185,400.00	185,400.00
ලුණු සේදීම	312,000.00	4,244,901.37	4,556,901.37
අලෙවිය - වෙනත්	277,746,312.70	-	277,746,312.70
	358,293,062.70	144,280,876.37	502,573,939.07

මුළු විකුණුම්

සටහන -04

යන්ත්‍රාගාරය	අනු සටහන	මුළු විකුණුම්	වැට්	ශුද්ධ විකුණුම්	විකුණුම් පිරිවැය	දළ ලාභය	දළ ලාභය
		රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	රු. ශත	**2022/2023**
අලි මංකඩ	සටහන 4 A	358,293,062.70	-	358,293,063	127,230,923	231,062,139	156,153,133
මන්නාරම	සටහන 4 B	144,280,876.37	-	144,280,876	90,301,936	53,978,940	19,225,985
එකතුව		502,573,939.07	-	502,573,939	217,532,859	285,041,080	175,379,118

(පිටුව 17)

මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන -04 A

2024 මාර්තු මස 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා අලිමංකඩ ලුණු ලේවායේ

යන්ත්‍රාගාරය - වෙළඳ ගිණුම

	මෙ.ටො.	2024 රු. ශත	2023 රු. ශත
ආදායම			
ලුණු අලෙවිය	9,688	358,293,063	250,658,205
අඩු කළා - විකුනුම් පිරිවැය			
වර්ෂය ආරම්භයේ දී තොග සාමාන්‍ය ලුණු තොග සිදු කෙරෙමින් පවතින වැඩ	404	8,760,797	8,650,548
එකතු කළා			
වර්ෂය තුළ සාමාන්‍ය ලුණු නිශ්පාදනය ගබඩා වියදම් සේවා මධ්‍යස්ථානය සඳහා වියදම්	10,676	138,782,987	94,615,359
අඩු: වර්ෂය අවසාන යේ දී තොග සාමාන්‍ය ලුණු තොග	1,392	20,312,861	8,760,835
විකුණුම් පිරිවැය	9,688	127,230,923	94,505,073
දල ලාභය		231,062,139	156,153,132

(පිටුව 18)

ජාතික ලුණු සමාගම
අලි මංකඩ ලුණු ලේවායේ යන්ත්‍රාගාරය
මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන -04 A - 1

වර්ෂය සඳහා - සාමාන්‍ය ලුණු නිශ්පාදන පිරිවැය

නිශ්පාදන පිරිවැය

		2024 රු. ශත	2023 රු. ශත
ඍජු වියදම්	අනු සටහන්		
කරදිය බෙදා හැරීම සහ ලුණු පාත්ති සකස් කිරීම	4A-1.1	**18,032,178**	**10,496,372**
ලුණු එකතු කිරීම සහ ප්‍රවාහනය	4A-1.2	**66,647,616**	**34,964,225**
		84,679,794	45,460,597
වක්‍ර වියදම්			
ප්‍රධාන ගබඩාව සහ ප්‍රවාහනය	4A-1.3	668,933	1,650,173
වැඩ පළ සහ උපකරණ	4A-1.4	6,635,652	4,479,986
ලුණු ලේවාය නඩත්තුව	4A-1.5	**1,523,852**	**4,032,563**
		8,828,437	**10,162,722**
ප්‍රාථමික පිරිවැය			
කාර්ය මණ්ඩල ශුභ සාදන කටයුතු	4A-1.6	19,319,029	15,561,812
ආයතනික වියදම්	4A-1.7	5,064,006	6,616,363
ක්ෂය කිරීම් සහ ක්‍රමක්ෂය	4A-1.8	20,891,722	16,814,114
		45,274,756	**38,992,289**
නිශ්පාදන පිරිවැය		**138,782,987**	**94,615,608**

(පිටුව 19)

ජාතික ලුණු සමාගම
අලි මංකඩ ලුණු ලේවායේ යන්ත්‍රාගාරය
මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන -04 A - 1

නිශ්පාදන පිරිවැය - සාරාංශය

	Sub Note	2024	2023
		රු. ශත	රු. ශත
සෘජු වියදම්			
කරදිය බෙදා හැරීම සහ ලුණු පාත්ති සකස් කිරීම	4A-1.1		
ඉන්ධන වියදම්		7,106,493	5,320,371
විදුලි පොම්පය		4,551,636	2,540,057
පොම්පය නඩත්තු කිරීම		6,374,050	2,635,944
		18,032,178	10,496,372
ලුණු එකතු කිරීම සහ ප්‍රවාහනය	4A-1.2		
තාවකාලික පඩි නඩි		38,361,589	18,597,389
තාවකාලික පඩි නඩි - සතිපතා		170,655	1,355,376
මාසික දිරි දීමනා		-	4,121,926
අවදානම් අවසස්ථා දිරි දීමනා		16,751,275	5,483,698
අතිකාල ගෙවීම්		389,626	371,402
නිවාඩු ගෙවීම්		251,223	184,850
තේ දීමනාව		2,105,251	1,047,089
රසායනාගාර වියදම්		4,888	13,833
ඇසුරුම් ද්‍රව්‍ය		2,858,872	989,481
සේවක අර්ථසාධක අරමුදල		4,603,390	2,239,383
සේවක භාර කාර අරමුදල		1,150,848	559,547
		66,647,616	**34,963,975**
වක්‍ර වියදම්			
ප්‍රධාන ගබඩාව සහ ප්‍රවාහනය	4A-1.3		
ට්‍රැක්ටරය සහ ටේලරය නඩත්තුව		491,595	1,522,570
වාහන වියදම්		177,338	127,603
		668,933	**1,650,173**
වැඩ පළ සහ උපකරණ	4A-1.4		
යන්ත්‍ර උපකරණ නඩත්තුව		917,254	24,359
යන්ත්‍ර උපකරණ නඩත්තුව - වෙනත්		10,130	6,100
නිශ්පාදන උපකරණ සහ මෙවලම් නඩත්තුව		5,624,268	4,223,787
විදුලි කාර්මික ගෙවීම්		44,000	219,740
නිශ්පාදන උපකරණ සහ මෙවලම්		40,000	6,000
		6,635,652	**4,479,986**

ලුණු ලේවාය නඩත්තුව 4A-1.5

සංග්‍රහ වියදම්	**443,117**	**651,790**
පුවත්පත් සහ වාරික සඟරා		
ජලය	**981,087**	**290,564**
රක්ෂණය	**73,298**	**47,803**
ලුණු ලේවායේ යන්ත්‍ර නඩත්තු කිරීම	**26,350**	**3,042,406**
	1,523,852	**4,032,563**

(පිටුව 20)

<u>මූලික වියදම්</u>			
<u>කාර්ය මණ්ඩල ගෙවීම් සහ වැටුප්</u>	4A-1.6		
වැටුප්		13,851,736	9,999,593
ෙස්වක දීමනා			468,000
කාර්ය මණ්ඩල නිල ඇඳුම්		959,770	145,786
සේවක අර්ථසාධක අරමුදග		1,648,783	1,172,339
සේවක භාර අරමුදල		412,196	293,811
තේ දීමනාව - ස්ථිර කාර්යය මණ්ඩලය		569,400	394,925
කාර්ය මණ්ඩල ශුභ සාධනය		384,657	3,600
ලාභය - ප්‍රසාද දීමනා		1,492,487	3,083,758
		19,319,029	**15,561,81**2
ආයතනික වියදම්	4A-1.7		
පුවත්පත් දැන්වීම්		_	39,120
ගොඩනැගිලි නඩත්තුව		1,209,251	974,374
ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයීම් කමිටු දීමනා		330,000	54,000
කාර්යාල උපකරණ නඩත්තුව		45,724	111,600
කාර්යාලය නඩත්තුව		259,235	272,045
තැපැල් ගාස්තු		69,608	221,617
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය		297,408	243,015
වෘත්තීමය වියදම්		60,000	55,200
දුරකථන		168,778	130,758
ලිපිද්‍රව්‍ය වියදම්		100,675	17,900
ප්‍රවාහන සහ ගමන් වියදම්		1,455,712	2,624,735
- තත්ව සහතික පරීක්ෂණ වියදම්		14,391	239,806
වාහන නඩත්තුව		5,000	804,820
ආරක්ෂක සේවා		1,048,224	796,872
කාර්යාල පරිපාලනය		-	30,500
		5,064,006	**6,616,363**
අඩු කිරීම් සහ ක්‍රමක්ෂය	4A-1.8		
PPE- අලි මංකඩ		5,881,129	1,989,522
අලි මංකඩ ලුණු ලේවායේ යන්ත්‍රාගාරය පුනරුත්තාපනය		186,000	
ක්‍රමක්ෂය		14,824,592	14,824,592
		20,891,722	**16,814,114**
නිශ්පාදන පිරිවැය		**138,782,987**	**94,615,358**

(පිටුව 21)

ජාතික ලුණු සමාගම

මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන - 04 B

මන්නාරම ලුණු ලේවායේ යන්ත්‍රාගාරය සඳහා 2024 වර්ෂයේ මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වෙළඳ ගිණුම

		2024	2023
	මෙ. ටොන්	රු. ශත	රු. ශත
ආදායම			
ලුණු අලෙවිය	2,386	144,280,876	92,482,765
අඩු කළා - විකුණුම් පිරිවැය			
වර්ෂය ආරම්භයේ දී තොගය	264	8,178,326	2,691,372
සාමාන්‍ය ලුණු තොග			
සිදු කෙරෙමින් පවතින වැඩ			
එකතු කළා			
වර්ෂය තුළ සාමාන්‍ය ලුණු නිශ්පාදනය	4,099	112,239,191	78,743,734
ගබඩා වියදම්			
සේවා මධයස්ථාන සඳහා වියදම්			
වර්ෂය අවසාන වන විට තොග			
සාමාන්‍ය ලුණු තොග	1,977	30,115,581	8,178,325
විකුණුම් පිරිවැය	2,386	90,301,936	73,256,780
දල ලාභය		**53,978,940**	**19,225,985**

<u>ජාතික ලුණු සමාගම</u>

<u>මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්</u>
<u>සටහන - 04 B -1</u>
<u>මන්නාරම ලුණු ලේවායේ යන්ත්‍රාගාරය සඳහා 2024 වර්ෂයේ මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා වෙළඳ ගිණුම</u>

නිශ්පාදන පිරිවැය

	අනු සටහන්	2024 රු. ශත	2023 රු. ශත
සෘජු වියදම්			
කරදිය බෙදා හැරීම සහ ලුණු පාත්ති සකස් කිරීම	4 B-1.1	6,144,970	4,280,944
එක් රැස් කිරීම සහ ප්‍රවාහනය	4 B-1.2	51,617,034	42,301,082
ලුණු ගබඩා කිරීම		-	-
		57,762,004	46,582,027
වක්‍ර වියදම්			
ප්‍රධාන ගබඩා සහ ප්‍රවාහනය	4 B-1.3	1,226,607	300,255
වැඩ බිම් සහ උපකරණ	4 B-1.4	27,167,728	6,210,170
ලුණු ලේවාය නඩත්තු කිරීම	4 8-1.5	506,647	293,292
		28,900,982	6,803,717
මූලික වියදම්			
කාර්ය මණ්ඩල ශුභ සාධනය	4 B-1.6	16,266,521	16,557,601
ආයතනික වියදම්	4 B-1.7	3,601,735	3,824,109
ක්ෂය	4 B-1.8	5,707,949	4,976,280
		25,576,205	25,357,990
නිශ්පාදන පිරිවැය		**112,239,191**	**78,743,734**

(පිටුව 22)

ජාතික ලුණු සමාගම

මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන -04 B -1

මන්නාරම ලුණු ලේවායේ යන්ත්‍රාගාරය සඳහා 2024 වර්ෂයේ මාර්තු 31 වන දිනෙන් අවසන් වන වර්ෂය සඳහා නිශ්පාදන පිරිවැය සාරාංශය

	අනු සටහන්	2024 රු. ශත	2023 රු. ශත
සෘජු වියදම්			
කරදිය බෙදා හැරීම සහ ලුණු පාත්ති සකස් කිරීම			
ඉන්ධන ගාස්තු		3,023,809	1,688,272
විදුලි පොම්පය		3,121,161	1,809,689
පෙම්පය නඩත්තු කිරීම		-	782,983
		6,144,970	4,280,944
ලුණු අස්වැන්න එක් රැස් කිරීම සහ ප්‍රවාහනය			
තාවකාලික පඩි නඩි		20,471,511	12,465,655
තාවකාලික පඩි- නඩි - සතිපතා		1,945,141	948,891
මාසික දිරි දීමනා		11,609,133	3,316,267
අවදානම් අවස්ථා දීමනා		9,833,075	3,779,467
අතිකාල ගෙවීම්		498,282	313,602
නිවාඩු ගෙවීම්		311,736	292,909
තේ දීමනාව		1,104,114	685,875
රසායනාගාර වියදම්		2,638,565	1,027,048
ඇසුරුම් ද්‍රව්‍ය		134,750	17,604,692
සේවක අර්ථසාධක අරමුදල		2,456,582	1,493,342
සේවක භාර අරමුදල		614,146	373,336
		51,617,034	42,301,082
වක්‍ර වියදම්			
ප්‍රධාන ගබඩා සහ ප්‍රවාහනය	4 B-1.3		
ට්‍රැක්ටර් සහ ටේලර් නඩත්තු ිරීම			
වාහන වියදම්		1,226,607	300,255
		1,226,607	300,255
වැඩ බිම් සහ උපකරණ	4 B-1.4		
යන්ත්‍ර නඩත්තු කිරීම		-	4,407,992
යන්ත්‍ර නඩත්තු කිරීම - වෙනත්		-	1,643
නිශ්පාදන උපකරණ සහ මෙවලම් නඩතත්තු කිරීම		27,167,728	1,800,427
නිශ්පාදන උපකරණ සහ මෙවලම්			
		27,167,728	6,210,063

(පිටුව 23)

ලුණු ලේවාය නඩත්තුව			
සංග්‍රහ වියදම්		218,815	163,353
පුවත්පත් සහ වාරික සහරා		15,480	14,160
ජලය		272,352	115,480
රක්ෂණය			
ලුණු ලේවාය යන්ත්‍රාගාර නඩත්තුව		-	300
		506,647	293,293
<u>මූලික පිරිවැය</u>			
කාර්ය මණ්ඩල ගෙවීම් සහ වැටුප්	4 B-1.6		
වැටුප්		12,067,632	11,850,167
සේවක දීමනා		-	317,000
කාර්යය මණ්ඩල නිල ඇඳුම්		-	58,800
සේවක අර්ථ සාධක අරමුදල		1,445,566	1,365,061
සේවක භාර අරමුදල		361,392	341,266
තේ දීමනාව - ස්ථිර කාර්ය මණ්ඩලය		473,700	419,425
කාර්ය මණ්ඩල ශුභ සාධනය		584,318	135,435
ලාභය ප්‍රසාද දීමනා		1,333,913	2,070,447
		16,266,521	**16,557,601**
”“ ආයතනික වියදම්	4 B-1,7		
"*			
වරිපනම් සහ බදු		**14,152**	14,152
ඉඩම් කල්බදු කුලිය		-	6,246,240
ගොඩනැගිලි නඩත්තුව		1,135,314	300,641
ප්‍රසම්පාදන සහ තාක්ෂණික ඇගයීම කමිටු ගාස්තු		-	12,500
කාර්යාල උපකරණ නඩත්තුව		63,145	151,480
කාර්යාල නඩත්තුව		89,750	227,109
තැපැල් ගාස්තු		62,017	49,336
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය		568,992	640,512
වෘත්තීමය වියදම්		29,400	17,800
දුරකථන		206,722	149,081
ලිපි ද්‍රව්‍ය වියදම්		-	
ප්‍රවාහන වියදම් සහ ගමන් ගාස්තු		355,631	405,292
තත්ව සහතික පරීක්ෂණ ගාස්තු		22,468	213,024
වාහන නඩත්තුව		5,921	315,960
ආරක්ෂක සේවා		1,048,224	796,872
කාර්යාල පරිපාලනය		-	6,190
		3,601,735	**9,546,189**
කිරීම් සහ ක්ෂය			
PPE- මන්නාරම		5,707,949	4,933,347
		5,707,949	4,933,347
නිෂ්පාදන පිරිවැය		**112,239,191**	**84,422,774**

(පිටුව 24)

ජාතික ලුණු සමාගම

2024 වර්ෂයේ මාර්තු 31 වන දිනට මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන 5

	2024	2023
	රු. ශත	රු. ශත
අනෙකුත් ආදායම් සහ ප්‍රතිලාභ		
රජයේ ප්‍රතිපාදන ක්‍රමක්ෂය	14,824,592	14,824,592
නිල නිවාස කුලී ලැබීම්	122,677	172,610
ස්ථාවර වත්කම් බැහැර කිරීමේ ලාභය	-	273,506
විවිධ ආදායම්	520,000	309,100
වෙන්දේසි ආදායම	268,275	
	15,735,544	15,579,808

සටහන 6

	2024	2023
	රු. ශත	රු. ශත
විකුණුම් සහ බෙදා හැරීමේ වියදම්	1,239,174	526,558
ව්‍යාපාර ප්‍රවර්ධන වියදම්	10,580,479	6,204,507
අලෙවි ප්‍රවර්ධන නිලධාරී ඉලක්ක වියදම්	1,096,069	-
සාමජ ආරක්ෂණ බදු	7,964,800	-
	20,880,522	**6,731,065**

(පිටුව 25)

<u>සටහන 7</u>

	පරිපාලන වියදම්	2024 රු. ශත	2023 රු. ශත
	සභාපති දීමනා	1,542,900	1,552,735
	සභාපති සඳහා නවාතැන් වියදම්	**362,933**	**-**
	ඉන්ධන සහ ලිහිසි ද්‍රව්‍ය වියදම්	**85,000**	**76,620**
	ක්‍රියාකාරී අධ්‍යක්ෂ දීමනා	756,167	-
	අධ්‍යක්ෂ වරුන්ගේ ගාස්තු	1,456,095	1,201,500
	අධ්‍යක්ෂ වරුන්ගේ නවාතැන් වියදම්	237,605	-
	අධ්‍යක්ෂ මණ්ඩල රැස්වීම් වියදම්	193,494	397,795
	ක්‍රියාකාරී අධ්‍යක්ෂ සඳහා ඉන්ධන දීමනා	565,621	-
	සාමාන්‍යධිකාරීවරයාගේ නවාතැන් දීමනා	300,000	-
	පඩි නඩි සහ වේතන	9,144,287	6,461,192
	සේවක අර්ථ සාධක අරමුදල	1,090,916	747,202
	සේවක භාරකාර අරමුදල	272,729	186,800
	අතිකාල සහ නිවාඩු දින ගෙවීම්	319,497	167,835
	සේවක දීමනා	938,563	81,000
	අර්බුද අවස්ථාවන් සඳහා දීමනා	1,926,150	768,933
	නිවාඩු දීමනා	201,114	147,678
	මාසික දිරි දීමනා	858,017	556,800
	පාරිතෝෂික ප්‍රතිපාදන	1,831,340	1,219,457
	ලාභය සහ වාර්ෂික ප්‍රසාද දීමනා	200,389	175,681
	කාර්ය මණ්ඩල නිල ඇඳුම්	128,420	18,000
	වෘත්තීය දීමනා - කාර්ය මණ්ඩල	188,933	109,100
	තේ දීමනාව ඇතුළු කාර්ය මණඩල සුබ සාධනය	1,040,789	514,592
	සම්මන්ත්‍රණ වියදම්	172,825	330,675
	ප්‍රවාහන සහ යැපුම් දීමනා	1,257,305	941,038
	පුවත් පත් සහ වාර සඟරා	44,970	43,900
	විගණන ගාස්තු - භාහිර විගණනය	384,000	352,000
	අභ්‍යන්තර විගණන ගාස්තු‘	-	172,819
	වරිපනම් දහ බදු	-	177,942
	කළමනාකරුවන් සඳහා නවාතැන්	130,177	-
	උපදේශණ සහ වෘත්තීය ගාස්තු	2,030,887	1,187,161
	ගිණුම් තැබීමේ මෘදුකාංග පද්ධති වැඩිදියුණු කිරීම	293,992	223,200
	පුහුණු කිරීම් සංවර්ධනය කිරීමේ ආයෝජන	74,000	700,770
	ජල බිල් සහ උපයෝගිතා බිල්	449,521	154,837
„	පුවත්පත් දැන්වීම්	1,481,356	3,086,743
	තැපැල් ගාස්තු	49,090	55,472
	දුරකථන	407,817	303,650
	විදුලි ගාස්තු	1,383,800	786,623
	පිරික්සුම් සහ සංචාරක ගාස්තු	1,129,948	219,626
	පරීක්සණ ගාස්තු	-	47,715
	තාක්ෂනික ඇගයීම් කමිටු ගාස්තු	49,000	97,850
	මිළ තීරණය කිරීමේ කමිටු වියදම්	111,750	17,519

	විගණන කළමනාකරණ කමිටු ගාස්තු	494,145	363,050
	වාර්ෂික ලියාපදිංචි ගාස්තු	347,808	7,245
	සමාගම් ලේකම් ගාස්තු	111,503	89,643
	මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	1,272,478	1,176,602
	මෝටර් රථ ධාවන වියදම්	1,504,190	2,847,069
	මෝටර් රථ ධාවන වියදම් - ඉංධන සහ ලිහිසි ද්‍රව්‍ය	895,216	613,620
	මෝටර් රථ කුලී	3,552,000	1,554,353
	මෝටර් රථ කුලී දීමනා	1,008,333	968,333
	මෝටර් රථ ඉන්ධන දීමනා	747,469	789,392
	ගොඩනැගිලි කුලිය - ප්‍රධාන කාර්යාලය	1,800,000	-
	ඇසුරුම් වියදම්	-	250
	රක්ෂණ	50,773	30,379
	වාර්ෂික මහා සභා රැස්වීම	143,630	-
	නව බඳවා ගැනීම් සඳහා දැන්වීම් පළ කිරීම	776,396	-
	ටෙන්ඩර් දැන්වීම පළ කිරීම	183,524	-
	උපකරණ නඩත්තුව	765,227	1,141,311
	සංග්‍රහ වියදම්	79,167	176,638
	කාර්යාල ගොඩනැගිල්ල නඩත්තු කිරීම	1,113,081	1,572,935
	වෙබ් අඩවි නිර්මාණය	245,000	14,500
	පරිත්‍යාග	40,000	20,000
	සිදුවීම් වියදම්	1,171,903	-
	ක්ෂය	1,098,620	533,055
	ආදායම් බදු දඩ මුදල්	76,828	-
		50,568,685	31,952,185

(පිටුව 26, 27)

සටහන් 8

මූල්‍ය පිරිවැය සහ ආදායම්	**2024** රු. ශත	**2023** රු. ශත
මූල්‍ය පිරිවැය		
බැංකු ගාස්තු	609,337	47,740
බැංකු ණය පොලී	-	87,958
විදේශ විනිමය ඉහළ පහළ යාම		
	609,337	135,698
මූල්‍ය ආදායම්		
ස්ථිර තැන්පතු මත පොලී	58,216,559	42,841,697
ඉතුරුම් මත පොලී	411,606	987,205
කාර්ය මණ්ඩල ණය පොලී	136,605	131,666
	58,764,770	43,960,568

(පිටුව 28)

ජාතික ලුණු සමාගම

2024 මාර්තු 31 වන දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන 09

	2024 රු. ශත	**2023** රු. ශත
ආදායම් බදු සාරාංශ		
වර්ෂය සඳහා ආදායම් බදු ප්‍රතිපාදන	86,770,710	44,919,479
	2,482,643	13,146,163
	89,253,353	58,065,642

සටහන 10

	2024 රු. ශත	**2023** රු. ශත
සාමාන්‍ය කොටස් හිමියන් වෙත පැවරිය හැකි කළ හැකි ශුද්ධ ලාභය (අලාභය).	198,640,695	134,086,255
ගණනය කළ සාමාන්‍ය කොටස් සංඛ්‍යාව වර්ෂය තුළ නිකුත් කිරීම්	300,000	300,000
කොටසකට මූලික ඉපැයීම (රු.)	662	470

<u>කොටසක මූලික ඉපයීම</u>

කොටසකට මූලික ඉපැයීම් ගණනය කිරීම පදනම් වන්නේ සාමාන්‍ය කොටස් හිමියන්ට පැවරිය හැකි ශුද්ධ ලාභය වසර තුළ පවතින ගණනය කළ සාමාන්‍ය කොටස්වල සාමාන්‍ය සංඛ්‍යාවෙන් බෙදීම මතය.

කොටසකට මූලික ඉපැයීම (රු.)	662	470

(පිටුව 29)

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන

මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

11	දේපළ, යන්ත්‍ර සහ උපකරණ				
11.1	ඉදිරියට ගෙනා දල වටිනාකම	**2023.04.01** දිනට ශේෂය	ලැබීම් / මාරුකිරීම් / මිලදී ගැනීම්	බැහැර කිරීම්/ මාරුකිරීම්	**2024.03.31** දිනට ශේෂය
	පිරිවැය හෝ තක්සේරුව	රු.	රු.	රු.	රු.
	කර්මාන්තශාලා ඉඩම - බදු	42,900,000	-	-	42,900,000
	ගොඩනැගිලි	15,631,462	1,772,391	-	17,403,853
	ලුණු කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ	38,403,069	195,690	-	38,598,759
	යන්ත්‍රෝපකරණ, මෙවලම් සහ ජල පොම්ප	18,432,805	20,372,894	-	38,805,698
	ට්‍රැක්ටර	10,415,300	1,790,000	-	12,205,300
	මෝටර් වාහන	1,255,725	250,000	-	1,505,725
	පරිගණක උපකරණ	4,282,160	1,930,111	-	6,212,271
	කාර්යාල උපකරණ	3,631,922	2,307,920	-	5,939,842
	රසායනාගාරය උපකරණ	987,083	-	-	987,083
	මෙවලම් සහ උපකරණ	2,478,746	1,076,980	-	3,555,726
	ගෘහ භාණ්ඩ සහ උපකරණ	3,615,494	1,161,603	-	4,777,098
	යටිතල පහසුකම් ක්‍රමක්ෂය කිරීම - අලිමංකඩ	96,261,491	-	-	96,261,491
	වත්කම්වල ක්ෂය විය හැකි මුළු වටිනාකම	**238,295,256**	**30,857,588**	**-**	**269,152,844**

11.2	ක්ෂයවීම සහ දුර්වල වීම	2023.04.01 දිනට ශේෂය	ලැබීම් / මාරුකිරීම් / මිලදී ගැනීම්	බැහැර කිරීම්/ මාරුකිරීම්	2024.03.31 දිනට ශේෂය
	පිරිවැය හෝ තක්සේරුව	රු.	රු.	රු.	රු.
	ගොඩනැගිලි,	5,657,557	828,550	-	6,486,107
	ලුණු කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ	9,549,159	3,835,874	-	13,385,033
	යන්ත්‍රෝපකරණ, මෙවලම් සහ ජල පොම්ප	9,019,884	3,342,718	-	12,362,603
	ට්‍රැක්ටරය	3,355,383	1,732,569	-	5,087,952
	මෝටර් වාහන	1,255,723	6,166	-	1,261,889
	පරිගණක උපකරණ	2,526,470	849,354	-	3,375,824
	කාර්යාල උපකරණ	1,473,308	821,366	-	2,294,674
	රසායනාගාරය උපකරණ	987,082	-	-	987,082
	මෙවලම් සහ උපකරණ	472,618	486,314	-	958,931
	ගෘහ භාණ්ඩ සහ උපකරණ	1,869,247	805,947	-	2,675,194
	යටිතල පහසුකම් ක්‍රමක්ෂය කිරීම - අලිමංකඩ	60,979,464	14,824,594	-	75,804,058
		97,145,896	**27,533,451**	**-**	**124,679,347**

(පිටුව 30)

11.3	කපා හැරී වටිනාකම				
	ඉදිරියට ගෙනා දල වටිනාකම	2023.04.01 දිනට ශේෂය	ලැබීම් / මාරුකිරීම් / මිලදී ගැනීම්	බැහැර කිරීම්/ මාරුකිරීම්	2024.03.31 දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.
	කර්මාන්තශාලා ඉඩම	42,900,000		-	42,900,000
	ගොඩනැගිලි,	9,973,905		-	10,917,746
	ලුණු කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ	28,853,910		-	25,213,726
	යන්ත්‍රෝපකරණ, මෙවලම් සහ ජල පොම්ප	9,412,920		-	26,443,096
	ට්‍රැක්ටරය	7,059,917		-	7,117,348
	මෝටර් වාහන	-		-	243,836
	පරිගණක උපකරණ	1,755,690		-	2,836,447
	කාර්යාල උපකරණ	2,158,613		-	3,645,168
	රසායනාගාරය උපකරණ	1		-	1
	මෙවලම් සහ උපකරණ	2,006,128		-	2,596,794
	ගෘහ භාණ්ඩ සහ උපකරණ	1,746,248		-	2,101,904
	යටිතල පහසුකම් ක්‍රමක්ෂය කිරීම - අලිමංකඩ	35,282,027		-	20,457,433
	වත්කම්වල ක්ෂය විය හැකි මුළු වටිනාකම	141,149,358		-	144,473,498
	කරගෙන යන ප්‍රධාන වැඩ	2023.04.01 දිනට ශේෂය	ලැබීම් / මිලදී ගැනීම්	වර්ෂය තුළ ප්‍රාග්ධනීකරනය කිරීම	2024.03.31 දිනට ශේෂය
		රු.	රු.	රු.	රු.
	ගොඩනැගිලි,		87,248,992	-	87,248,992
	ලුණු කර්මාන්තශාලා යන්ත්‍රෝපකරණ		8,394,078	-	8,394,078
	යන්ත්‍රෝපකරණ, මෙවලම් සහ ජල පොම්ප		78,433,620	-	78,433,620
			174,076,691	**-**	**174,076,691**
					318,550,188.19

2024.03.31 දිනට සම්පූර්ණයෙන්ම ක්ෂය වූ මුදල රු. 10,665.819.27 ක් වන අතර නැවත තක්සේරු කළ වත්කම් මුදල රු. 4,909,500.00 කි.

(පිටුව 31)

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා වන

මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන 12

වට්ටෝරු භාණ්ඩ පොත් (ඉන්වෙන්ට්‍රි)

සටහන 12.1

2024 2023

රු. රු.

නිමි භාණ්ඩ	2024.12.31 දිනට තොග වාර්තාව			
	අලිමංකඩ		මන්නාරම	
	ප්‍රමාණය	අගය	ප්‍රමාණය	අගය
අයඩීන් මිශ්‍ර ලුණු - කි.ග්‍රෑ. 01 පැකට්ටුව			27.04	1,012,918
ගජා අයඩීන් මිශ්‍ර ලුණු - කි.ග්‍රෑ. 01 පැකට්ටුව			3.10	116,126
ගැඹුරු ටැංකි - අංක 1	50.03	732,439	1,925,02	28,586,477
සාමාන්‍ය ලුණු අංක 1	125.99	1,844,524		
සාමාන්‍ය ලුණු අංක 2	519,37	7,603,631		
සාමාන්‍ය ලුණු අංක 3	648.61	9,495,595		
ලුණු කැට අංක 1	0.00	-	14.85	284,972
අයඩීන් මිශ්‍ර නොකළ ලුණු අංක 1			7.75	115,088
ලුණු කැට අංක 2	18.05	331,579		
මඩ ලුණු ලුණු කැට	30.00	305,100		
නිමි භාණ්ඩ	**1,392,05**	**20,312,868**	**1,977.76**	**30,115,581**

50,428,449 16,939,168

සටහන 12.2

පරිභෝජන භාණ්ඩ

ඩීසල් සහ භූමි තෙල්	1,234,445	1,429,681
ඇසුරුම් ද්‍රව්‍ය	15,349,158	26,951,006
ලොඩනැගිළි ද්‍රව්‍ය	2,795,063	267,865
පොම්ප සඳහා අමතර කොටස්	4,215,519	3,450,054
මුද්‍රණ සහ ලිපි ද්‍රව්‍ය	1,100,483	850,250
මෙවලම් සහ ආම්පන්න	1,455,133	1,014,514
අනෙකුත් ඉන්වෙට්‍රි භාණ්ඩ	5,152,652	5,152,652
ගොඩනැගිළි නඩත්තු උපකරණ	2,201,454	2,726,183
යන්ත්‍ර සූත්‍ර අමතර කොටස්	3,750,098	639,787
	87,682,455	**59,421,161**

(පිටුව 32)

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන 13

මූල්‍ය වත්කම්			
කල්පිරීම සඳහා පවත්වාගෙන යන මූල්‍ය වත්කම්			
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	85912331	13,711,792	11,330,700
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	86060727	29,617,735	25,149,016
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	83932342	-	-
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	859123l3	-	-
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	86060767	-	-
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	86M8386	-	-
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	87832025	-	-
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	88670491	-	-
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	88670487	-	-
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012273	13,683,845	11,216,438
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012315	13,683,845	11,216,438
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012317	13,683,845	11,216,438
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012318	13,683,845	11,216,438
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012322	13,683,845	11,216,438
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012263	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012274	**12,340,253**	10,000,000

ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012278	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012282	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012285	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012290	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012299	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012302	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012308	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	89012312	**12,340,253**	10,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	90450449	**49,169,973**	40,000,000
ස්ථිර තැන්පතු - ලංකා බැංකුව	**90450435**	**49,169,973**	40,000,000
		333,491,229	**272,561,908**

(පිටුව 33)

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන 14

වෙළඳ සහ අනෙකුත් ලැබීම්	2024 රු.	2023 රු.
වෙළඳ ණයකරුවෝ භාණ්ඩාගාර අරමුදල් (අලි මංකඩ ලුණු ලේවා ව්‍යාපති))		
තැන්පතු සහ අත්තිකාරම්		
ලැබිය යු පොලී ආදායම්	23,648,268	29,378,530
අත්තිකාරම් - අලිමංකඩ	15,518	-
අත්තිකාරම් - ප්‍රධාන කාර්යාලය	90,119	-
අත්තිකාරම් - මන්නාරම	1,100	-
අත්තිකාරම්	123,722	-
අත්තිකාරම් - ඉදිකිරීම් සඳහා	14,204,817	-
ලැබිය යුතු වැට් බද්ද	19,158,994	-
රඳවා ගැනීමේ බද්ද	3,203,382	-
වැටුප් සහ අත්තිකාරම් - අලිමංකඩ	12,000	-
කාර්ය මන්ඩල ණයකරුවන්		
උත්සව අත්තිකාරම්	829,900	639,750
කාර්ය මණ්ඩල ණය	3,552,087	3,056,939
කාර්ය මණ්ඩල අත්තිකාරම්	37,195	150,000
	64,876,202	**33,225,219**

(පිටුව 34)

සටහන 15

මුදල් සහ මුදලට සමාන දෑ		**2024** රු.	**2023** රු.
බැංකුවේ ඇති මුදල්			
ලංකා බැංකුව	වැල්ලවත්ත ශාඛාව	18,042,794	31,166,850
	මන්නාරම ශාඛාව	175,291	38,970
	කිළිනොච්චි ශාඛාව	20,649	360,403
	ඉතිරි කිරීමේ ගිණුම	168,342	4S,779,316
		18,407,076	**77,345,538**

සටහන 16

ප්‍රකාශිත ප්‍රාග්ධනය	**2024** රු.	**2023** රු.
ප්‍රකාශිත ප්‍රාග්ධනය -300,000 සාමාන්‍ය කොටස් (නිකුත් කළ සහ සම්පූර්ණයෙන්ම ගෙවන ලද)	30,000,000	30,000,000

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන 17

ආදායම් ලැබීම්	2024 රු.	2023 රු.
අප්‍රේල් 01 වන දිනට ශේෂය	426,713,139	317,628,964
අඩු කළා - පෙර වර්ෂයේ කල් බදු කුලිය ගැළපීමේ ලාභාංශ	- -	(5,722,080) 311,906,884
එකතු කළා - වර්ෂය සඳහා ලාභය	198,593,129	134,806,255
අඩු කළා : ගෙවිය යුතු ලාභාංශ / වර්ෂය තුළ ගෙවීම්	(100,000,000)	(20,000,000)
මාර්තු 31 වන දිනට ශේෂය	525,306,268	426,713,139

සටහන 18

රජයේ අරමුදල්	2024 රු.	2023 රු.
ඉදිරියට ගෙනා ශේෂය වර්ෂය තුළ රජය විසින් සපයන ලද අරමුදල්	35,282,026 100,000,000	50,106,618 0
වර්ෂය තුල ලාභ සහ පාඩු සඳහා ගෙවීම්	14,824,592	(14,824,592)
ඉදිරියට ගෙන ගියා	**120,457,433.68**	**35,282,025.91**

(පිටුව 35)

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන 19

විලම්බිත බදු බැදීම්	2024 රු.	2023 රු.
අප්‍රේල් 01 වන දිනට ශේෂය	16,124,685	2,258,522
වර්ෂය සඳහා දේපළ සහ ඉඩම් මඟින් ප්‍රතිපාදන / (ප්‍රත්‍යාවර්තන)	(2,529,710)	13,146,163
වර්ෂය සඳහා දේපළ සහ ඉඩම් මඟින් ප්‍රතිපාදන / (ප්‍රත්‍යාවර්තන) OCI	-	720,000
මාර්තු 31 වන දිනට ශේෂය	**18,654,395.15**	**16,124,684.90**

සටහන (19.1)

දේපළ සහ ඉඩම් තුලින් ප්‍රතිපාදන	බදු ගෙවිය යුතු/ අඩු කළ හැකි තාවකාලික වෙනස්වීම්	වි. බදු අනුපාත	විලම්බිත බදු ප්‍රතිපාදන 2024 මාර්තු 31 දිනට	විලම්බීත බදු ප්‍රතිපාදන 2023 මාර්තු 31 දිනට
දේපළ, යන්ත්‍ර සහ උපකරණ	73,637,818	30%	22,091,345	18,568,734
විශ්‍රාම ප්‍රතිලාභ බැදීම්	(11,456,371)	30%	(3,436,911)	(3,164,050)
	-	30%		720,000
වෙනස	62,181,447		18,654,434	16,124,684

<u>ජාතික ලුණු සමාගමේ</u>

<u>2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා</u>

<u>වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්</u>

<u>සටහන - 20</u>	2024	2023
	රු.	රු.
<u>විශ්‍රාම ප්‍රතිලාභ බැඳීම්</u>		
අප්‍රේල් 01 වන දිනට ශේෂය	10,546,833	9,643,015
+ වර්ෂය සඳහා අයකිරීම්	785,678	775,794
+ වර්ෂය සඳහා පොලිය	634,465	892,347
+වර්ෂය සඳහා හිඟ /වැඩිපුර ගෙවීම්	411,199	(448,686)
එකතු කිරීම්: වර්ෂය සඳහා ප්‍රතිපාදන	1,831,342	1,219,457
	12,378,175	**10,862,471**
අඩුකිරීම්: වර්ෂය තුළ ගෙවීම්	(921,803)	(315,638)
මාර්තු 31 වන දිනට ශේෂය	**11,456,371**	**10,546,833**
සාමාන්‍ය විශ්‍රාම වයස (අවුරුදු)	60.00	60.00
අනාගත වැටුප් වර්ධක සඳහා අපේක්ෂිත අනුපාත	2.04%	5%
වට්ටම් අනුපාත	10.5%	10%
කාර්යය මණ්ඩල පිරිවැටුම් සාධක	14.63%	10%

(පිටුව 36)

සටහන - 21	2024 (රු.)	2023 (රු.)
වෙළඳ සහ අනෙකුත් ගෙවීම්		
ආපසු ගෙවිය යුතු තැන්පතු	1,803,803	2,618,513
උපචිත වියදම්	1,241,391	8,375,395
ෙගවිය යුතු වැටුප්	10,711,573	8,893,127
ලබා නොගත් වැටුප්	254,270	254,270
උපයන විට ගෙවීම් (ප්‍ර. කා. / මන්නාරම)	13,217	18,536
ගෙවිය යුතු සේවක අර්ථසාධක අරමුදල	2,276,580	1,581,034
ගෙවිය යුතු සේවක භාර අරමුදල	340,931	236,599
ගෙවිය යුතු විගණන ගාස්තු	412,260	760,800
ප්‍රසාද දීමනා ප්‍රතිපාදන	3,495,025	3,422,839
සමාගම ලියාපදිංචි කිරීමේ ප්‍රතිපාදන	7,135,954	
ගෙවිය යුතු රඳවා ගැනීම්	4,746,211	514,228
විකුණුම් අත්තිකාරම්	-	104,000
ගෙවිය යුතු මුද්දර බදු	19,250	11,850
ගෙවිය යුතු වැට්	2,771,711	-
ගෙවිය යුතු බදු කුලි	1,800,000	
ගෙවිය යුතු සභාපති දීමනා		2,888
වැටුප් අත්තිකාරම්		210,000
හඳුනා නොගත් තැන්පතු	3,000	
සඳහා ගෙවිය යුතු රඳවා ගැනීමේ බද්ද	31,999	
	37,057,174	26,998,303

ජාතික ලුණු සමාගමේ

2024 මාර්තු 31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා

වන මූල්‍ය ප්‍රකාශණ සඳහා සටහන්

සටහන **22**	2024 (රු.)	2023 (රු.)
ආදායම් බදු		
අප්‍රේල් 01 වන දිනට ශේෂය	36,358,203	10,924,427
එකතුකළා වර්ෂය සඳහා ප්‍රතිපාදන	86,770,710	44,919,479
ගෙවන ලද ආර්ථික සේවා ගාස්තු වර්ෂ තුළ ගෙවීම්	(49,241,040)	(19,330,000)
ගෙවන ලද රඳවා ගැනීමේ බදු	-	(155,703)
2023 මාර්තු 31 වන දිනට ශේෂය	**74,044,032**	**36,358,203**

ප්‍රාග්ධන බැඳීම්

මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කිරීමට අවශ්‍ය වන තරමේ වැදගත් ප්‍රාග්ධන බැඳීම් නොමැත.

අසම්භාව්‍ය බැරකම්

අලිමංකඩ ලුණු ලේවාය ඉඩම බදු ගෙවීමට යටත් වන අතර ඒ සඳහා ගෙවිය යුතු මුදල අවිනිශ්චිතය.

සම්බන්ධිත පාර්ශව අතර ගණුදෙනු

වර්ෂය තුළ දී සමාගම සහ සම්බන්ධිත පාර්ශව අතර ගණු දෙනු සිදු වී නොමැත.

(පිටුව 37)